# 2026.04.07 දින සාමාන්‍ය රැස්වීම් වාර්තාව.

## ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව.

2026 අප්‍රේල් මස 07 වන දින පෙ.ව 9.30 ට ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ ගරු සභාපති බන්ධුලසේන දූණුවිල මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ඇහැලියගොඩ ප්‍රධාන රැස්වීම් ශාලාවේ දී පැවති සාමාන්‍ය රැස්වීම් වාර්තාවයි.

**සහභාගීත්වය:-**

01.ගරු සභාපති බන්ධුලසේන දූණුවිල මැතිතුමා

02. ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා

03.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා

04.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා

05.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා

06.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අයි.එච්.රණවීර මැතිතුමා

07.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණිය

08.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩී.ගයානි බුද්ධිකා මැතිණිය

09.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.ඩිල්ෂාන් කාවින්ද මැතිතුමා

10.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා

11.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා

12.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා

13.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා

14.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිණිය

15.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා

16.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය

17.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එන්.එල්.රුවන්සිරි විමලරත්න මැතිතුමා

18.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා

19.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එල්.ජයසේකර මැතිතුමා

20.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා

21.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා

22.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා

23.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා

24.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය

25.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එම්.නෙල්සන් ජයසේකර මැතිතුමා

26.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එස්.එල්.දීපාල් මැතිතුමා

27.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා

28.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා

29.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී පී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිණිය

30.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා

31.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා

32.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා

33. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා

**නොපැමිණීම්**

01. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එස්.එන්.කේ.විජේසූරිය මැතිතුමා

02. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා

03. ගරු ප්‍රාදේශිය සභාමන්ත්‍රිනී සරෝජනී ජිනේන්ද්‍රානි මැතිණිය

**කාර්ය මණ්ඩලය**

| | |
|---|---|
| 01. ආර්.ඩී. නලින් පුෂ්පකුමාර මහතා | - ලේකම් |
| 02. ජී.අයි.කේ.ජයතුංග මිය | - සංවර්ධන නිලධාරී |
| 03. සී.චන්දිමා ප්‍රියදර්ශනී මිය | - වැඩ ක්ෂේත්‍ර කම්කරු |

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් පැමිණ සිටි මන්ත්‍රිරුන්, මන්ත්‍රිවරියන්, මාධ්‍යවේදින්, ලේකම්තුමා හා කාර්යාලයේ නිලධාරින් දෙපළ පිළිගැනිමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

**(අ) 2026.03.10 වන දින පැවති සාමාන්‍ය රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම.**

2026.03.10 වන දින පැවති සාමාන්‍ය රැස්වීමේ වාර්තාව සභා සම්මත කරන ලෙස ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් දන්වන ලදී.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා**

2026.03.10වනදිනපැවති සාමාන්‍ය රැස්වීමේ වාර්තාවේ, යෝජනා අංක 6.44 යටතේ පිටු අංක 44 හි යෝජනාව ඉදිරිපත් කරන විට ආරියදාස මන්ත්‍රීතුමා විසින් බාධා කිරීම් කළ බවත්, එම අවස්ථාවේ ආරියදාස මන්ත්‍රීතුමාට ප්‍රකාශ කළ කාරණා හා ආරියදාස මන්ත්‍රීතුමා විසින් ප්‍රකාශ කළ කාරණාව වාර්තා වී නොමැති බවත් සඳහන් කරන ලදී.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය**

2026.03.10 වන දින පැවති සාමාන්‍ය රැස්වීමේ වාර්තාවේ, 43 පිටුවේ, ප්‍රජා ශාලාව සාදා ඔසු උයන හදන්න යෝජනා වුණ බවත්, ඒම අවස්ථාවේ ඒ ස්ථානය ප්‍රජා ශාලාවකටයි ක්‍රීඩා පිට්ටනියකටයි වෙන් කර තිබෙන බව තමා විසින් ප්‍රකාශ කළ බවත්, එම කාරණාව වාර්තාවේ වාර්තා වී නොමැති බවත් සඳහන් කරන ලදී.

2026.03.10 වන දින පැවති පසුගිය සාමාන්‍ය රැස්වීමේ වාර්තාව සංශෝධන සහිතව සම්මත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්. එම්. අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා යෝජනා කළ අතර,ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.ඒ අනුව 2026.03.10 වන දින පැවති පසුගිය සාමාන්‍ය රැස්වීම් වාර්තාව සභා සම්මත විය.

**(ආ) සභාපතිවරයා විසින් සභාව වෙත ඉදිරිපත් කළ යුතු නිවේදන.**

නිවේදන දෙකක් තිබෙනවා.පළමු විශේෂ නිවේදනය පළාත් පාලන කොමසාරිස්, එල්.එම්.පී.ඩබ්.බණ්ඩාර මැතිතුමා,

"සබරගමු පළාත් සියලුම පළාත් පාලන ආයතන ප්‍රධානීන් වෙත, යනුවෙන් සඳහන් කොට ඇති බවත්, 2023 අංක 09 දරණ දූෂණ විරෝධී පනත ප්‍රකාරව 2025 වර්ෂයට අදාළව නියමිත දිනට වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් නොකිරීම සම්බන්ධවයි.උක්තකරුණ සම්බන්ධයෙන් සබරගමුව පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක සී.එස් 03/08 වත්කම් බැරකම් ප්‍රකාශ හා 2026.03.22 දිනැති ලිපිය හා බැඳේ. එමගින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂක ජනරාල් අංක ඩීජී/සීජ්/ජ්ඩී/144 හා 2026-03-11 දිනැතිව සියලුම අයතන ප්‍රධානීන් වෙත නිකුත් කර ඇති උපදෙස් ලිපියේ පිටපතක් මන්ත්‍රීවරු වෙත යොමු කරන බවත්, වත්කම් කොමිෂන් සභා චක්‍රලේඛ 1/2025 හි මාර්ගෝපදේශවලට අනුව නව ඩිජිටල් ආකෘතිය යටතේ අදාළ වත්කම් හා බැරකම් ප්‍රකාශ සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතු බැවින් ඒ අනුව කටයුතු කරන මෙන් දන්වමි."

මෙය අත්‍යවශ්‍ය කාරණයක් බවත්, වත්කම් බැරකම් ඉදිරිපත් කළේ නැත්නම් ගැටළු රාශියකට මුහුණ දෙන්න සිදු වන බවත් සඳහන් කරන ලදී.

දෙවන නිවේදනය, ද සබරගමු පළාත් කොමසාරිස්තුමා විසින් ඒවා ඇති බවත් , ඒම නිවේදනය ද ප්‍රාදේශිය සභා සභිකයින්ට ගෙවනු ලබන වියදම් දීමනාව සම්බන්ධව ආණ්ඩුකාරතුමිය ලබා දී ඇතිඋපදෙස් මාලාවක් පවතින බවත්, ඒම ලිපියේ පිටපතක් මේ වන විට සියලුම මන්ත්‍රීවරුන්ට ලබා දී ඇති බවත්, ගරු සභාපති බන්ධුලසේන දූණුවිල මැතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**(ඇ) සභා රැස්වීමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා.**

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී සරෝජනී ජිනේන්ද්‍රානි මැතිණිය, 2026-04-07 වන දින මහා සභා රැස්වීමට පැමිණීමට නොහැකි බව දන්වා ලිපි යොමු කර තිබෙන බවත්, එය මේ මොහොතේ සභාගත කරන බවත්, ගරු සභාපති බන්ධුලසේන දූණුවිල මැතිතුමා විසින් ඉදිරිපත් කළ අතර, එම නිවාඩු අනුමත කිරීමේ යෝජනා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**(ඈ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි ඉදිරිපත් කිරීම. - නැත**

**(ඉ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න. - නැත**

සියලුම මන්ත්‍රීතුමන්ලාට හා මන්ත්‍රීතුමියන්ලා සභා රීති 37.10 අනුව කටයුතු කරන ලෙස ගරු සභාපති බන්ධුලසේන දූණුවිල මැතිතුමා විසින් උපදෙස් දෙන ලදී.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනි ආර්.වත්සලා නිශාන්ති ධනරත්න මැතිණිය**

තමන් විසින් ඉද්රිපත් කළ යෝජනා දෙකක් න්‍යාය පත්‍රයෙන් ඉවත් කර ඇති බවත්, ඒ පිළිබඳව කණගාටුව ප්‍රකාශ කරන බවත්, කාරක සභා හරහා කතා කරලා විසඳගන්න පුළුවන්කමක් තියෙනවා නම් ඒ හරහා සාකච්ඡා කිරිමට කාරක සභා සඳහා යොමු කරන බවත්, ඒම යෝජනා කාරක සභා මඟින් කතා කර විසඳුම් ලබා ගත නොහැකි බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනි ආර්.වත්සලා නිශාන්ති ධනරත්න මැතිනියප්‍රකාශ කළේය.

**ගරු සභාපති බන්දධූලසේන දූණුවිල මැතිතුමා**

මෙවර න්‍යාය පත්‍රයට යෝජනා විශාල ප්‍රමාණයක් ඇතුළත් නොකළ බවත්, ඒම ඇතුළත් නොකිරිමට හේතුව නිරාකරණය කර ගැනිම සඳහා සභාව කාරක සභාවක් බවට යෝජනා කර ලෙස ගරු සභාපති බන්ධුලසේන දූණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.ඒ අනුව උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් සභාව කාරක සභාවක් කිරිමට යෝජනා කළ අතර,ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා විසින් ඒම යෝජනාව ස්ථිර කරන ලදී.

සභා ලේකම් විසින් යෝජනා ප්‍රතික්ෂේප කිරීමට හේතු වූ කාරණා පැහැදිලි කරන ලදී.

කාරක සභාව මහා සභාවක් බවට ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්.අමිල් නිමේෂ් බණ්ඩාර මැතිතුමා විසින් යෝජනා කළ අතර, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා විසින් ඒම යෝජනාව ස්ථිර කරන ලදී.

**(ඊ) යථා පරිදි කල් දී ඇති යෝජනා.**

**01(i) ගරු සභාපති බන්දූලසේන දූණුවිල මැතිතුමා**

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවට ඩෙස්ටොප් පරිගණක යන්ත්‍ර 04 ක් ලැප්ටොප් පරිගණකයක්, පරිගණක ප්‍රින්ටරයක්, ප්‍රොජෙක්ටර් යන්ත්‍රයක් මිලට ගැනීම වෙනුවෙන් රු.1,745,928.00 ක මුදලක්H.K. කොම්පියුටර් සොලියුෂන් පුද්ගලික සමාගම නමින් ගෙවිය යුතු අතර, බිල්පත් සීමාව මුදල් කමිටු සීමාව ඉක්මවා යන බැවින් එම මුදල සභා අරමුදලින් ගෙවීමට සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව උප සභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**01(ii) ගරු සභාපති බන්ධුලසේන දූණුවිල මැතිතුමා**

උඩුවක ග්‍රාම නිලධාරි වසමේ අ.ග සි.අංක 658 ලොට් අංක 395 දරණ හෙක්ටයාර් 0.176 ක් විශාල උඩුවක වසම නාවටරොද ඉඩම් කොටස නො.415/A උඩුවක ගැටහැත්ත ලිපිනයේ පදිංචි පද්මපෙරුම ආරච්චිලාගේ ආනන්ද පාලිත පත්මපෙරුම යන අයට කෘෂිකාර්මික කටයුතු සඳහා දීර්ඝ කාලීන බදු ලබා දීමට අවශ්‍ය එකඟතාවය ලබා දෙන මෙන් ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම්ගේ EHE/DS/LND/DO-01/02/21/01 අංක දරන2026.03.04 දිනැති ලිපියෙන් දන්වා ඇති බැවින් ඒ සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බව යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා**

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා විසින් ස්ථිර කර අතර, මෙම ඉඩම තමන් නියෝජනය කරන කොට්ඨාශයට අයත් ප්‍රශ්න සහගත ඉඩම් කොටසක් බවත්, මෙම යෝජනාව කාර්මික කමිටුවට හෝ යොමු කර තීන්දුවක් ගැනීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

**ගරු සභාපති බන්දධුලසේන දූණුවිල මැතිතුමා**

මෙහි ඉඩම් අයිතිය තිබෙන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට බවත්, පුද්ගලයෙකුගේ පුද්ගලික පරිහරණය සඳහා බදු දෙන විට සාමාන්‍යයෙන් ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ඉල්ලන බවත්, කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා අදහස් දක්වන ආකාරයට සභාවෙන් තීරණයක් ගැනීමට නොහැකි නම් කාර්මික සේවා කාරක සභාව හෝ ඒකාබද්ධ කාරක සභාවට යොමු කර තීරණයක් ගනිමු දැයි ගරු සභාපති බන්ධුලසේන දූණුවිල මැතිතුමා විසින් විමසන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා**

මෙම ඉඩම සම්බන්ධව තියෙන ප්‍රශ්නයපිළිබඳව සභාව දැනුවත් කරන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච් එම් පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා**

මෙම ඉඩම් කොටස පොදුවේ භාවිතා කරන රිසිවේෂන් ඉඩම් කැල්ලක් බවත්, ගමේ මිනිසුන් පොදු කටයුතු සඳහා ප්‍රයෝජනයට ගන්නා බවත්, නාපාවල උඩුවක ගම් දෙකේම අය පෞද්ගලිකව පරිහරණය කරන්න කිසිම කෙනෙකුට දෙන්න අකමැතිබවත්, කලිනුත් මෙවැනි යෝජනාවක් බවත්, එය ක්‍රියාත්මක කිරීමට ගම්වැසියන් නොදුන් බවත්, නැවත අලුතින්මෙම යෝජනාව පැමිණ ඇති බවත්, මෙම යෝජනාවට සභාවක්

විදිහට කැමැත්ත ප්‍රකාශ කළ හොත් හැමෝටම ගැටළුකාරී තත්වයකට මුහුණ දීමට සිදුවන බවත්, පොදුවේ භාවිතයට ගන්නවා නම් අපි කමිටුවකට යොමු කර, පරීක්ෂණයක් සිදුකර, පොදුවේ භාවිත කිරීමට අවස්ථාව ලබා දෙන්නේ නම් පමණක් ගම්වැසියන් කැමති වන බවත්, ඒසේ නොමැතිව පුද්ගලික පරිහරණයට ලබා දෙනවට ගම් වැසියන් අකමැති බවත් ප්‍රකාශ කරන ලදී.

**ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා**

එම ස්ථානයේ ඉදිකිරීම් සිදු කිරීමට නොහැකි බවත්, NBRO වාර්තාව ලබා නොදෙන බවත්, නාය අවධානම් සහිත ස්ථානයක් බැවින්, කෘෂි කාර්මික වැඩ කටයුත්තකට යෙදවීමට හදන බවත්, ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා**

මෙම යෝජනාව න්‍යාය පත්‍රයට එන්න හේතුව මොකක්ද යන්න විමසන ලදී.

**ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා**

ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන්,ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අයත් ඉඩමක් නිදහස් කරන විට සභාවේ කැමැත්ත විමසා සිටින බවත්, මෙය සභාවට අයිති ඉඩමක් නොවන බවත්, සභාවක් විදිහට හැමෝගේම අදහස් අනුව මෙය පුද්ගලික පරිහරණයකට දීමට කැමතිද යන්න විමසීම සඳහා මෙසේ සභා යෝජනාවක් ලෙස න්‍යාය පත්‍රයට යෝමු කළ බවත්, ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින්ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි දිලීන් කරුණාපාල මැතිතුමා**

කොට්ඨාශයේ ගරු සෙනරත් කස්තුරිආරච්චි මන්ත්‍රීතුමා විසින් මෙම ඉඩම් කොටස මහජනතාවගේ පොදු කටයුතු සඳහා අවශ්‍ය බවට ප්‍රකාශ කළ බව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට දන්වා යැවිය යුතු බවත්, එම නිසා සභාවට දීර්ඝ කාලීන බදු පවරා ගැනීමට හෝ සභාවට පොදු වැඩකට යොදා ගැනීමට අවස්ථාව ලබා දෙන්න ලෙසට මේ සභාවේදී මේ අවස්ථාවේදි ම යෝජනාවක් කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි දිලීන් කරුණාපාල මැතිතුමා ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා**

මෙම ඉඩම කුඹුරු ඉඩමක් නෙවෙයි නම්, සේවා පියසක් වැනි අත්‍යවශ්‍ය කාරණයකට භාවිතා කිරීමට සුදුසු නොමැතිද යන්න විමසන ලදී.

**ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා**

මෙවැනි යෝජනා නැවත තිබුණොත් යෝජනා ස්ථිර කරන්නේ නැතුව, සාකච්ඡා කර අවසානයේ තීන්දුවක් ගෙන ස්ථිර කිරීමට කටයුතු කරන ලෙසත්, මෙම යෝජනාව ස්ථිර කළ බැවින් සංශෝධන යෝජනාවක් ලෙස නැවත ඉදිරිපත් කිරීමට සිදු වන බවත්, එම නිසා සංශෝධිත යෝජනාවක් ලෙස නැවත ඉදිරිපත් කරන ලෙසත් ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි දිලීන් කරුණාපාල මැතිතුමා**

ගරු සභාපතිතුමනි, සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා ප්‍රකාශය අනුව කලින් සභාවකට මේ ඉඩම සම්බන්ධව යෝජනාක් ඉදිරිපත් වෙලා තිබු බවත්, හිටපු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ගරු කරුණාදාස මැතිතුමා පොදු කටයුතු සඳහා යොමු කිරීමට සුදුසු බවට යෝජනාවක් කලින් ගෙනාවාද යන්න සම්බන්ධව නිවරදි තොරතුරු තමා නොදන්න බවත්, ඒසේ යෝජනාවක් තිබෙනවා නම් මේ ඉඩම සභාවට පවරා දෙන්න ලෙසට ඒ අනුව ක්‍රියාත්මක වෙන්න හැකියාවක් පවතින බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

**ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා**

මෙම ප්‍රශ්න සහගත ඉඩම පිළිබඳව සභාවට කලින් සභාවකට යෝජනාවක් ඉදිරිපත් කර තිබේද යන්න විමසන ලදී.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා**

කලින් සභාවට යෝජනාවක් යොමු කර අති බවට හිතන බවත්, පෞද්ගලිකව මිනිස්සු එම ඉඩම අයිති කර ගැනීමට හැදූ බවත්, පසුව මිනිස්සු එකතු වි, ඉඩම බේරා ගැනිම සඳහා ප්‍රාදේශිය ලේකම් කාර්යාලය දැනුවත් කළ බවත්, වන වගාවක් පවත්වාගෙන යෑම කටයුතු කළ බවත්, මෙය පාර අයිනේ තියෙන හොඳ ඉඩමක් බවත්, සභාවට පවරා ගැනීමට හැකි නම් ඒය ඉතා වටිනා බවත්, හිටපු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ගරු කරුණාදාස මැතිතුමා සිටින කාලෙත් ඒ ගැන දැනුවත් වෙන්න ඇති යැයි එතුමා ප්‍රකාශ කළ අතර, ඒ කාලේ සිට ම කිසිවෙකුට පෞද්ගලිකව පරිහරණය කරන්න ඉඩ නොදුන් බවත් ප්‍රකාශ කරන ලදී.

**ගරු සභාපති බන්ධුලසේන දූණුවිල මැතිතුමා**

එසේනම් පොදු කාර්යක් සඳහා සභාවට පවරා ගැනිමට සුදුසු බවට සංශෝධිත යෝජනාවක් මේ අවස්ථාවේ ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති බන්ධුලසේන දූණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා**

ගරු සභාපතිතුමනි,ඒ යෝජනාව එතුමාගේ පෞද්ගලික යෝජනාවක් හැටියට නොව, සභාවක් හැටියට ඒක වැදගත් බවත්, සභාවට ඉඩම් සොයා ගත නොහැකි අවස්ථාවක, හෙක්ටයාර් 0.176 ක මෙම ඉඩම සභාවට පවරා ගැනිමට කටයුතු කළ යුතු බවත්,ප්‍රකාශ කළ අතර මෙතුමා විසින් සංශෝධිත යෝජනාවක් ලෙස **"මෙය සභාවට පවරා ගැනීම සඳහා මම යෝජනා කරනවා."** යැයි එම ඉඩම සභාවට පවරා ගැනිමට යෝජනා කළේය.

ඒ අනුව මෙම යෝජනාවට සංශෝධිත යෝජනාවක් ඉදිරිපත් කරමින් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා විසින් මෙය සභාවට පවරා ගැනීම සඳහා මම යෝජනා කරනවා." යැයි එම ඉඩම සභාවට පවරා ගැනිමට යෝජනා කළ අතර, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සහික දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.ඒ අනුව සංශෝධිත යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**01(iii) ගරු සභාපති බන්ධුලසේන දූණුවිල මැතිතුමා**

නවීකරණය කරන ලද ඇහැලියගොඩ මහජන පුස්තකාල ගොඩනැගිල්ල තුළ ස්ථාපිත කරන ලද වැසිකිළි පද්ධතියේ වැසිකිළි 3 න් වැසිකිළි 02 ක් පොදු මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා වෙන් කිරීමට සුදුසු බවට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු සභාපති බන්ධුලසේන දූණුවිල මැතිතුමා**

ඇහැලියගොඩ මහජන පුස්තකාලය අලුතින් වහලයක් ගසා නවීකරණය කළ බවත්, ඒහි තිබූ වැසිකිළියට අමතරව නව වැසිකිළි දෙකක් සැකසූ බවත්, නගරය මධ්‍යට පොදු වැසිකිළියක අවශයතාවය පවතින හෙයින් එම වැසිකිළි දෙක මහජනතාව සඳහා ලබා දිමට හැකි බවත්, ඒ සඳහා මුදලක් අය කරනවා ද නැද්ද යන්න් එය කොපමණ මුදලක්ද යන්නත් සභාවේ තීරණය කළ යුතු බවත්, ගරු සභාපති බන්ධුලසේන දූණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා**

වැසිකිළි තුනෙන් දෙකක් මහජනතාවට දෙනවිට අනෙක් වැසිකිළි එම දෙකට සම්බන්ධයක් නොමැතිද යන්න විමසන ලදී.

**ගරු සභාපති බන්ධුලසේන දූණුවිල මැතිතුමා**

පුස්තකාල ගොඩනැගිල්ලේ තිබුණ වැසිකිලිය තිබෙන බවත්, පුස්තකාලයට වැඩි පිරිසක් නොයෙන බැවින්, එය කාන්තා පිරිමි ලෙස වෙන් කිරීමට අවශ්‍ය නොවන බවත්, ඊට අමතරව පළාත් සභාවෙන් තව වැසිකිළි දෙකකට මුදලක් වෙන් වුණ බවත්, දැන් ඒ වැසිකිළි දෙක හදලා තිබෙන බවත්, පුස්තකාලයට වැසිකිළි තුනක් අවශ්‍ය නොවන බැවින් ගේට්ටුවක් දමා වෙන් කොට ඉන් දෙකක් මහජනතාවගේ පරිහරණයට ලබා දීම සුදුසු යැයි හැඟුණ බැවින් මෙය සභා යෝජනාවක් ලෙස ඉදිරිපත් කළ බවත් ගරු සභාපති බන්ධුලසේන දූණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා**

මෙම යෝජනාය හොඳ යෝජනාවක් බවත්, පසුගිය ආණ්ඩුව පැවති කාලයේ ගරු ගාමිණී වලේබොඩ මැතිතුමත් ප්‍රතිපාදන වෙන් කරගෙන මෙම කටයුත්ත සිදුකරන්න උත්සාහ කළ බවත්, නමුත් යම් යම් කරුණු මත එය සිදු කිරීමට නොහැකි වු බවත්, වැසිකිළි 03 ම වුණත් මහජනතාවට ලබා දෙන්න පුළුවන්නම් හොඳ බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒම්. පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන්නට විය.

**ගරු සභාපති බන්ධුලසේන දූණුවිල මැතිතුමා**

ඒහෙම වුණොත් එතන ප්‍රායෝගික ගැටළුවක් මතු වන බවත්, ඒ නිසා 03ම භාවිතා කරන්න බැරි බවත්, එසේ වුණොත් පුස්තකාලය ඇතුළින් මහජනතාව ගමන් ගන්නා බවත්, දෙකක් වෙන් කර ගේට්ටුවක් දැමිය යුතු බවත්,මහජනයා යන එක වළක්වන්න අලුතින් හදපු දෙකට ගේට්ටුවක් දමන බවත් ප්‍රකාශ කළේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා**

රු.20.00ක මුදලකට ටිකට් එකක් දෙන්න පුළුවන්නම් සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා ප්‍රකාශ කළේය.

**ගරු සභාපති බන්ධුලසේන දූණුවිල මැතිතුමා**

එම ස්ථානය පර්චස් 07 ක් පමණක් පවතින බවත්, එය ප්‍රාදේශීය සභාවට ප්‍රදානය කරපු පුද්ගලයා ලබා දී තිබෙන්නේ පුස්තකාලයකට පමණක් ලෙස ඒ ඔප්පුවේ තිබෙන බවත්, එම නිසා එතන වෙනත් කටයුත්තකට යොමු කරන්න බැරි බවත්, ඒතනට සේවකයෙක් යෙදවීමට නොහැකි බවත්, වැසිකිළි දෙක කාන්තා පිරිමි කියල වෙන්කරන්න පුළුවන් බවත්, මුදලක් අය කිරීමට සේවකයෙක් දැම්මොත් ඔහුට ඉන්න තැනක්වත් දීමට නොහැකි බවත්, මුදල් දැමීමට පෙට්ටියක් සවි කිරිමට හැකි බවත්, ටෙන්ඩර් ගැනීමට කිසිවෙකු ඉදිරිපත් වෙතැයි සිතිය නොහැකි බවත් ගරු සභාපති බන්ධුලසේන දූණුවිල මැතිතුමා විසින් කියා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා**

මෙම වැසිකිළි පද්ධතිය මහජනතාවට ලබා දීමට කටයුතු කිරිම පිළිබඳව සතුටු වෙන බවත්, මැණික් පොළේ වැසිකිළිය පිළිබඳව ඔබතුමා මැදිහත් වෙලා,මේවන විට අංග සම්පූර්ණ වැසිකිළියක් බවට පරිවර්තනය කරලා තිබෙන බවත්, ගරු මාලින්ද මන්ත්‍රීතුමා පැහැදිලි කළපරිදි නගරය මැද වැසිකිළියත් අත්‍යවශය බවත්, මේ හරියට ගැළපෙන විදිහට එය හදල තිබෙන බවත්, පොළේ වැසිකිළිය ද සුද්ද පවිත්‍ර තර පිළිවෙලකට තිබෙන බවත්,මේ වැසිකිළි පද්ධති සමහර විට නගර සැලැස්මේදී වෙනස් වීමට හැකි බවත්, නමුත් මේ වෙලාවේඉතාමත්ම සතුටින් මේ පිළිබඳව ප්‍රකාශ කරන බවත් කියා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා**

මෙම වැසිකිළි පද්ධතිය නඩත්තු වෙන විදිහ කොහොමද යන්න විමසන ලදී.

**ගරු සභාපති බන්ධුලසේන දූණුවිල මැතිතුමා**

අපේ සෞඛ්‍ය කම්කරුවන් සිටින බවත්, කෙනෙක් එතෙන්ට යොදවන්න පුළුවන් බවත්, නමුත් කෙනෙක් ඒතනට දවසෙම යොදවන්න බැරි බවත්, සුද්ද පවිත්‍ර කිරීමට පමණක් යෙදවිය හැකි බවත්, ප්‍රකාශ කළේය.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා**

ස්වයං කියන වචනය භාවිතා කළාට එය වෙන්නේ නැති බවත්, කවුරුහරි පුද්ගලයෙක් ඒතනට යොමු කරනව නම් හොඳ බවත්, නිකන් දෙන දේ අගයක් නැති බවත් ප්‍රකාශ කළේය.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනි ආර්.වත්සලා නිශාන්ති ධනරත්න මැතිනිය**

තමාගේ පළමු සභා යෝජනාවෙම තිබුණ දෙයක් පහළ ප්‍රදේශයට වැසිකිළියක් අවශ්‍යයි කියන එක බවත්, වැසිකිළියක් හදන්න තිබුණ ඉඩම ඒ කාලයේ සිටි එක් එක් පුද්ගලයින් විසින් විකුණලා ඒවා විනාශ කර දැමූ බවත්, මේ වෙලාවේ තමාගේ පියා වූ හිටපු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ආර් .ධනරත්න මන්ත්‍රීතුමා මතක් කළ යුතු බවත්, ඒ සඳහා ඒතුමා ලොකු වෙහෙසක් දැරූ බවත්, නමුත් විසඳුමක් ලබා ගැනිමට නොහැකි වූ බවත්,මේ වගේ ස්ථානයක වැසිකිළියක් සෑදීම පිළිබඳව සතුටු වෙන බවත්,ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනි වත්සලා නිශාන්ති ධනරත්න මැතිණිය ප්‍රකාශ කළේය.

**ගරු සභාපති බන්ධුලසේන දූණුවිල මැතිතුමා**

මේ සඳහා අය කරන මුදල පිළිබඳව හා නඩත්තු කටයුතු කරන ආකාරය පිළිබඳව මුදල් කාරක සභාවේදී තීරණයක් ගැනීම සුදුසු බවට ගරු සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කළේය.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා**

ගරු සභාපතිතුමා මේ ගැන ප්‍රකාශ කළ කාරණාව නිවරදි බවත්, සෞඛ්‍ය කම්කරුවෙකු දෛනිකව යෙදවීමට අවශ්‍ය නොවන බවත්, එය අපිරිසිදු වුවහොත් පුස්තකාලාධිපති විසින් සභාවට එය දැනුවත් කිරීමට කටයුතු ලෙස දන්වීමට කටයුතු කිරීම සුදුසු බවත්,ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා විසින් ප්‍රකාශ කළේය.

යෝජනාව, අය කරන ගාස්තුව හා නඩත්තු කටයුතු පිළිබඳව ඉදිරි මුදල් කාරක සභාවේදී සාකච්ඡාකිරීමෙන් අනතුරුව තීරණයක් ගැනීමට එකඟව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**01(iv) ගරු සභාපති බන්ධුලසේන දූණුවිල මැතිතුමා**

අංක 253/ඒ, විජේනායක මාවත, ඇහැලියගොඩ ලිපිනයෙහි පදිංචි ජාතික හැදුනුම්පත් 198609000289 අංක හිමි ආර් ඉන්දික සම්පත් ජයසේකර යන අය සෞඛ්‍ය කම්කරුවෙකු ලෙස තත්කාර්ය පදනම මත, සේවා ගිවිසුම්ගතව බඳවා ගැනීමටත්, ඔහුට 10/2025 චක්‍රලේඛ විධිවිධානයන්ට අනුව වැටුප් ගෙවීමටත් යෝජනා කරමි.

මෙම යෝජනාව උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු සභාපති බන්ධුලසේන දූණුවිල මැතිතුමා**

සෞඛ්‍ය කම්කරුවෙකු ලෙස ගන්න සිදු වුණේ පොළ භූමියේ මුර සේවයේ යෙදෙන කම්කරු මහතා තව මසකින් පමණ විශ්‍රාම ගනු ලබන බවත්, අදාළ විෂයභාර නිලධාරීතුමිය නව සේවකයෙක් බඳවා ගත්තා නම් සුදුසු යැයි යෝජනා කළ බවත්, මොහු මෙම ප්‍රදේශයේ අහළ පහළම තැනැත්තෙක් බවත්, මේ යෝජනාව දැම්මට, දැනට සිටින කෙනා විශ්‍රාම ගිය පසුව සේවයට ගන්නා බවත් ගරු සභාපති බන්ධුලසේන දූණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කළේය.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනි ආර්.වත්සලා නිශාන්ති ධනරත්න මැතිනිය**

සභාපතිතුමනි,මෙහි ආර්. ඉන්දික සම්පත් ජයසේන ලෙස නිවැරදි විය යුතු බවට ප්‍රකාශ කළේය.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**01(v)** **ගරු සභාපති බන්ධුලසේන දූණුවිල මැතිතුමා**

ඇහැලියගොඩ නගරය ආශ්‍රිත ප්‍රදේශ කීපයක මේවන විට අවිධිමත් ලෙස කසල බැහැර කිරීම සිදු කරනු ලබයි.ඒ අනුව නිසි අයුරින් කසල බැහැර ලෙස ව්‍යාපාරික ප්‍රජාව හා ප්‍රදේශවාසීන් දැනුවත් කිරීම සඳහා හදුනාගත් ස්ථාන 08 ක,අඩි 03 පළල අඩි 05 දිග සහ අඩි 07 ක් උස යකඩ බට 02 කින් රැදවීම සඳහා දැන්වීම් පුවරු ස්ථාපිත කිරීම සුදුසු බවට යෝජනා කරමි.

මෙම යෝජනාව උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු සභාපති බන්ධුලසේන දූණුවිල මැතිතුමා**

මෙම යෝජනාව ගෙන ඒමට හේතුව වුණේ මෙය ලොකු මුදලක් වැය වන්න් එකක් නොවන නිසා බවත්, මහජනයා සඳහා ඉදිරිපත් කරන දැන්වීමක් නිසා සභාවේ අනුමැතිය ගත යුතු බවත්, එම ස්ථාන 08 සියලුදෙනාම දන්නා ස්ථාන බවත්, ඒ පිළිබඳව දැනුවත් කිරීම සඳහා මෙලෙස යෝජනාවක් ඉදිරිපත් කළ බවත්, උප සභාපතිතුමා විසින් එම ස්ථාන 8 පිළිබඳව දැනුවත් කරන ලෙසත් දන්වන ලදී.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා**

එම ස්ථාන 8 ලෙස හඳුනාගෙ ඇත්තේ,රත්නපුර පැත්තෙන් නගරයට පිවිසෙන ස්ථානයේ, මාහිංගොඩ දූව ඉදිරිපිට, යාය පාර හන්දිය, බුළුගහපිටියට හැරෙන නැඳුරන පාර හන්දිය ඉදිරිපිට, ජයසිරි බෙහෙත් කඩය ඇතුල් පාර, කමර්ෂල් බැංකුව පිටුපසින් රේල් පාර, ධර්මපාල විදුහල ඉදිරිපිට යන ස්ථානවල බව උප සභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් පෙන්වා දෙන ලදී.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා**

එම දැන්වීම් ගහන්නේ මොකක් කියලාද යනුවෙන් පැහැදිලි කිරීමක් අවශ්‍ය බව ප්‍රකාශ කරන ලදී.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා**

ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන හරහා මෙම දැන්වීම් සැකසීම සිදු කරන බව ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා**

ක්ලීන් ශ්‍රී ලංකා ව්‍යාපෘතිය මඟින් සිදුකරනවා නම් සභාව විසින් වියදම් දැරිය යුතු නැති බවත්, එම ව්‍යාපෘතිය හොඳ ව්‍යාපෘතියක් බවත්, ක්ලීන් ශ්‍රී ලංකා කියලා ව්‍යාපෘතියේ නම සටහන් කරනවා නම්මධ්‍යම රජය වියදම් කරලා යම් කිසි ව්‍යාපෘතියකට වියදම් දරනව නම්,ඒ වෙනුවෙන් මුදලක් සභාවට අරගෙන සිදු කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන්නට විය.

**ගරු සභාපති බන්ධුලසේන දූණුවිල මැතිතුමා**

ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන හරහා මුදල් ලබා ගැනීමට හැකි බවත්, මහජනතාව සඳහා ප්‍රදර්ශනය කරන දැන්වීමක්බැවින් සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කළ බවත්, ගරු සභාපති බන්ධුලසේන දූණුවිල මැතිතුමාකියා සිටියේය.
ඒ අනුව යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**01(vi)** **ගරු සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමා**

ඇමුණුම් ලේඛනය xiii හි සඳහන් 2026 මාර් තු මස ගෙවීම් වාර්තාව සහා අනුමැතිය සඳහා යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීඑච්.ආරියදාස මැතිතුමාවිසින් ස්ථිර කරන ලදී. ඒ අනුව යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**01(vii)** **ගරු සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමා**

ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ ලේකම් ලෙස කටයුතු කළ ඩී.බී.එම්.තිවංක මහතා අසනීප වීම හේතුවෙන් ඔහු නැවත සේවයට වාර්තා කරන තෙක් ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව නමින් ඇහැලියගොඩ මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන අංක 085100170000674 ගිණුමේචෙක්පත්වල අත්සන් කිරීම සඳහා පහත උප ලේඛනයේ සඳහන් අයවලුන් වෙත 2012/21 දරන පළාත් පාලන ආයතන විශේෂ විධි විධානපනතේ 16 වගන්ති ප්‍රකාරව බලය පැවරීම සුදුසු බවට යෝජනා කරමි.

**උප ලේඛනය**

| නම | තනතුර | ජා.හැ.අංකය | අත්සන |
|---|---|---|---|
| 01.රණසිංහ දිසානායකගේ නලින් පුෂ්පකුමාර | ලේකම් | 741632799V | පළමු අත්සන්කරු |
| 02.සල්පිටි කෝරාලලාගේ අනූෂා රෝෂණී | කළමනාකරණ සේවා නිලධාරී | 197283802325 | පළමු අත්සන්කරු |
| 03.හෙට්ටි ආරච්චිලාගේ අනූෂා උදයංගනී හෙට්ටිආරච්චි | කළමනාකරණ සේවා නිලධාරී | 858172454 v | දෙවන අත්සන්කරු |

මෙම යෝජනාව උප සභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**01(viii) ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා**

එළඹෙන වෙසක් උත්සවය සැමරීම සඳහා ආගමික වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමටත්, ඒ සඳහා රුපියල් 150,000.00 ක මුදලක් සභා අරමුදලින් වැය දැරීමටත් සුදුසු බවට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා**

අයවැයෙන් මුදල් වෙන් කර තිබේ නම් ගැටළුවක් අති වනවාද යන්න විමසන ලදී.

**ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා**

සංස්කෘතික සහ ආගමික කටයුතු සඳහා මුදලක් වෙන් කොට තිබෙන බව ප්‍රකාශ කළේය.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීඒ.ටී.සී.අතුරලිය මැතිතුමා**

මෙහිදී සිදු කරන ආගමික වැඩසටහන කුමක්ද යන්න පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය බව ප්‍රකාශ කරන්නට විය.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා**

පිරිත් දේශනයක් සිදු කිරීම සුදුසු බවට ප්‍රකාශ කර සිටියේය.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා**

මෙය ගිහි පිරිතක්ද?පැවිදි පිරිතක්ද? යන්න පැහැදිලි කර ගත යුතු බවට ප්‍රකාශ කරන්නට විය.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා**

සභාව ඉදිරිපිට පන්සලක් තිබෙන නිසා ස්වාමීන් වහන්සේලා වඩම්මව ගෙන ඒම පහසු බැවින් භික්ෂූන් වහන්සේලා වඩම්වා පිරිත් දේශනයක් සිදු කිරිමට අදහස් කර සිටින බව උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

**ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා**

ඉදිරි මුදල් කාරක සභා රැස්වීමකදී ඒ සඳහා දිනයක් සාකච්ඡා කිරීමට කටයුතු කිරිම සුදුසු බව ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා ප්‍රකාශ කළේය.

යෝජනාව ස්වාමීන් වහන්සේලා වඩම්වා පිරිත් දේශනයක් සිදු කිරීමට හා පිරිත පැවැත්වෙන දිනය මුදල් කාරක සභාවේදී තීරණය කිරීමට සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**01(ix) ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා**

අවුරුදු උත්සව සමයේ 2026.04.01 සිට 2026.04.15 දක්වා කාලය තුළ ඇහැලියගොඩ නව හා පැරණි සතිපොළ භූමියේ අඩි 10 * අඩි 10 වූ තාවකාලික කඩ කාමර සකස් කර ගැනීම සඳහා,විදුලිය හා ජලය සැපයීමකින් තොරව භූමිය පමණක් බදු ලබාදීම වෙනුවෙන්,එක් බිම් කොටසකට දිනකට රුපියල් 1,000.00 බැගින් අය කර භූමිය තාවකාලිකව බදු ලබාදීමසුදුසු බවට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා**

එම මුදල අඩුකර සංශෝධනය විය යුතුයි යැයි ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා**

හට් කීයක් පමණ සකනවාද යන්න විමසන ලදී

**ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා**

සභාව විසින් හට් සකස් නොකරන බවත්, වෙළෙන්දන් විසින් ම තමන්ට අවශ්‍ය ආකාරයට සකස් කර ගන්නා බවත් ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීදිලීන් කරුණාපාල මැතිතුමා**

එසේ නම් රු.1000.00ක මුදලක් අය කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

**ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා**

තවම ආරම්භ කර නැති බවත්, අයදුම්පත් දීමුදල් බැඳලා තිබෙන බවත්, මෙම කඩ ලොකු කාලයක් නොපවතින බවත්, සභාවේ එකඟතාවයෙන් මුදල සංශෝධනය කරනවා නම් ගැටළුවක් නොමැති බවත්, ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා**

මෙම වැඩසටහනේදී පොළට පැමිණෙන ප්‍රමාණය අඩු බවත්, හැමෝම මේ නගරයේ පාර ආශ්‍රිතව වෙළදාම් කිරීමට උත්සාහ කරන බවත්, ඒම ස්ථානයේ වෙළදාම් කරන්න යොමු වෙලා තියෙන්නේ මුදල් තිබෙන අය නොවෙන බවත්,පුද්ගලයින් වතුර බිලයි විදුලි බිලයි ගෙවිය යුතු බවත්, එම නිසා රු. 1000.00ක මුදල වැඩි බවත්, මෙය තමන්ගේ පෞද්ගලික අදහස බවත්,මෙය දිය යුත්තේ මුදලක් අය නොකර බවත්, එසේ කිරීමට නොහැකි නිසාඑම නිසා මේ වෙලාවේ එම පුද්ගලයින්ට උදව්වක් හැටියට රු.250.00ක් වැනි මුදලක් අය කිරීම සුදුසු බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා විසින් ප්‍රකාශ කරන්නට විය.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා**

ඔය කියන කොටසේ මේවන විටත් කඩ කාමර ලබා දී ඇති බවත්, ඔවුන්ට රු.1000.00ක් කියන එක අවුරුදු කාලේ සාමාන්‍ය මුදලක් බවත්, ලොකු බිස්නස් එකක් මේ කාලයේ පවතින බවත්, පොළ හැදුවට පස්සේ පාර දෙපස වෙළඳාම් කිරීමට නොහැකි බැවින් වෙළෙන්දන්ට පොළට යැමට සිදු වන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා ප්‍රකාශ කරන ලදී.

**ගරු සභාපති බන්ධුලසේන දූණුවිල මැතිතුමා**

අවුරුදු කාලයට ඩෝසර් කරලා කඩ පේළියක් සැකසීමට භූමිය සකස් කර දීමට බලාපොරොත්තු වන බවත්,මාර්තු මාසයේ 06 වෙනිදා උසාවි තීන්දුවකින් එම භූමිය සභාවට ලැබුණ බවත්, රජයේ මිනින්දෝරු මැන වෙන් කර ගැනීමට අවශ්‍ය බව දන්වා සභාව විසින් එදිනම ලිපියක් රජයේ මිනින්දෝරු වෙත යැවූ බවත්, මේ වෙනතුරු ඒයට පිළිතුරක් නොලැබුණු බවත්, සම්බන්ධීකරණයේදී තමා විසින් ඒ ගැන ප්‍රශ්න කළ බවත්, රජයේ ආයතනයක් වුණත් මේ වන තෙක් උදව් කළේ නැති බවත්, ගරු සභාපති බන්ධුලසේන දූණුවිල මැතිතුමා විසින් සභාවේදී ප්‍රකාශ කරන්න ලදි.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා**

දැනට තිබෙන කඩ සඳහා අවස්ථාව දෙනවද යන්න විමසන ලදී.

**ගරු සභාපති බන්ධුලසේන දූණුවිල මැතිතුමා**

සභාවේ කොටස වෙන් කර සුද්ද කළාට පසු ඉස්සරහ කඩ දාන්න නොදෙන බව ප්‍රකාශ කළේය.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා**

මේ සම්බන්ධව පසුගිය මුදල් කාරක සභාවේදී තීරණයක් ගත් බවත්,මෙහිදී ඒය ප්‍රකාශ නෙවෙන බවත් කියා සිටියේය.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා**

ආදායම් පරිපාලක මහතා සැලැස්මක් කාරක සභාවේදී ඉදිරිපත් කළ බවත්, කඩ කාමර 50කට ඒ සැලැස්ම හදලා තිබෙන බවත්, එම කාර්ය ක්‍රියාත්මක කරන්න හැකිද යන්න සොයා බැලීමට සිකුරාදා දින එතෙන්ට ගිය බවත්, එහිදී බස් රථ හිමිකරුවන්ගෙන් විරෝධයක් පැමිණි බවත්, පොළේ ගහ යට මේ වන විට බස් නවත්වා තිබෙන බවත්, එම නිසා.ඔවුන්ගේ පැත්තෙන් සාධාරණ ඉල්ලීමක් පැමිණි බවත්, ඔවුන්ගේ ඉල්ලීම වුයේ නිශ්චිත බස් නැවතුම්පලක් නැති බැවින් බස්නැවතුමක් සාදා ඒ ක්‍රියාමාර්ගය ගැනීමට සුදුසු බවත්, ඒ චෝදනාව බස් හිමිකුවන්ගේ පැත්තෙන් සාධාරණ බවත්, විෂයභාර නිලධාරි මහත්මයත්, ආදායම් පරිපාලක මහතාත් ඒ අවස්ථාවේ සිටි බවත්, පොළ භූමියේ පාසල මායිමේ තිබෙන තාප්පය අයිනට සෙනඟ නොයෙන බවත්, එම නිසා අපි තීරණය කළා මාලු වෙළඳසැල දැමීමට හදපු කොටසයි, පොල භූමියට ඇතුළතින් යනව පාරක්, ඒ පාරත් ඒක්ක තියෙන ඉඩ කොටසින් ඒ 10*10 කඩකාමර ටික හිතුව බවත්, නගර සංවර්ධනය මේ අවුරුද්දෙ සිදු කරන බවත්, ඒ සමඟ පදික වෙළඳාම තහනම් කිරිමට හැකි බවත්, හරිත ආර්ථික මධ්‍යස්ථානයක් සැකසීම සැලස්මේ තිබෙන බවත්, ඒ තෙක් ඒ අය දිරි ගැන් විම සඳහාත් සභාවක් විදිහට නොමිලේ දෙන්නත් බැරි බැවින් ගරු ආරියදාස මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ පරිදි, රුපියල් 750.00 කට වගේ ලබා දෙන්න හැකිනම් දෙගොල්ලටම හොඳ බවත්, උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමාවිසින් ප්‍රකාශ කළේය.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා**

මුදල් කමිටුවේ තීරණය මෙතනදී වෙනස් වී ඇති බවත් තීන්දු ගැනීමේ දී මීට වඩා සැලකිලිමත් විය යුතු බවත්, නැත්නම් තීන්දු නොගත යුතු බවත්, ප්‍රකාශ කළේය.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා**

ගරු අතුරලිය මන්ත්‍රීතුමා කල ප්‍රකාශය නිවරදි බවත්, තීන්දුවක් ගන්නට පෙර ඒ ස්ථානයට ගොස් විමසිය යුතු බවත්, ඒතන තිබෙන ප්‍රශ්න පිළිබඳ සාකච්ඡා කළ යුතු බවත්, උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා ප්‍රකාශ කළේය.

**ගරු සභාපති බන්ධුලසේන දූණුවිල මැතිතුමා**

සභාව විසින් තිරණය කරන්නේ රුපියල් 750.00 ද 1000.00 ද යන්න විමසන ලදී.ඒ අනුව රුපියල් 500.00 කට දීමට තින්දු වු අතර රුපීයල් 1000.00 සංශෝධනය කර රුපියල් 500.00 ට යෝජනා කරන ලෙස සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා**

අවුරුදු උත්සව සමයේ 2026.04.01 සිට 2026.04.15 දක්වා කාලය තුළ ඇහැලියගොඩ නව හා පැරණි සතිපොළ භූමියේ අඩි 10 * අඩි 10 වු තාවකාලික කඩ කාමර සකස් කර ගැනීම සඳහා, විදුලිය හා ජලය සැපයීමකින් තොරව භූමිය පමණක් බදු ලබාදීම වෙනුවෙන්,එක් බිම් කොටසකට දිනකට රුපියල් 500.00 බැගින් අය කර භූමිය තාවකාලිකව බදු ලබාදීමසුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා**

මෙම සංශෝධිත යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා**

වෙළද සංගමයේ ඉල්ලීම පරිදි පදික වෙළදාමේ වෙළදම් කර සියලු දෙනා අලුත් ස්ථානයට යොමු කරන බවට ඒදින මුදල් කමිටුවේදී තීරණය වු බවත්, එය ක්‍රියාත්මක වෙනවාද යන්න දැන ගැනීමට කැමති බව ප්‍රකාශ කළේය.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා**

ජාතික පාසල ඉදිරිපිට වාහන නවත්තා වෙළදාම් කටයුතු කරන බවත් ඒය පසුගිය දින කීපයේ අසාමාන්‍ය විදිහට වැඩි වු බවත්, ඒතන පාර පටු බැවින් පොලීසිය සමඟ සාකච්ඡා කර ඒ වෙළෙන්දන් ඒතනින් ඉවත් කළ බවත්, නමුත් පදික වෙළෙන්දන් මේ දවස් ටිකට පමණක් අවස්ථාව දෙන ලෙසත්, පොළ භූමියේ සැලසුම් කර ඇති පරිදි බක්කි ගසා කඩ කාමර සකසා ගැනීමෙන් පසු පදික වෙළෙන්දන් පොළ භූමිට ගැනීමට සුදුසු බවට තමන් සිතන බවත්, වෙළෙන්දන් සිතන්නෙ පාරෙ සිටියොත් බිස්නස් වැඩි වෙන බවත් ඒ නිසා ඒ පුද්ගලයින්ගේ ආකල්පමය වෙනස් සිදු කළ යුතු බවත්, සභාවක් විදිහට සභාව පැත්තෙන් සිදු විය යුතු කාර්ය සිදු වී නොමැති නිසා මේ දවස් කීපයට අවස්ථාව ලබා දී කටයුතු කිරීම සුදුසු බවට උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන්නට විය.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා**

පාරෙ පාසල් භූමියේ අලංකාරයට සිටුවා ඇති මල් ගස් ආරක්ෂා කර ගැනිමට ක්‍රමවේදයක් තිබේද යන්න විමසන ලදී.

**ගරු සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමා**

අපි ඒ පිළිබදව විදුහල්පතිතුමියද ඒක්ව සාකච්ඡා කළ බවත්, සම්පුර්ණ පදික වෙළෙන්දන් ඉවත් කිරිමට සැදු බවත්, නමුත් අවුරුදු කාලය බැවින් ඉවත් නොකළ බවත්, ඒවා යථා පරිදි සකසා දීමට පදික වෙළෙන්දන් කැමති වු බවත්, ගරු සභාපති බන්ධුලසේන දූණුවිල මැතිතුමා ප්‍රකාශ කළේය.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා**

පදික වෙළෙදුන් ඉවත් කිරීමට තමා පුද්ගලිකව විරුද්ධ බවත්, එම මිනිසුන් ජීවත් වන්නේ ඒ වෙළදාමෙන් බවත්, ඒ අය ව්‍යාපාරික ස්ථානවලට බාධාවක් නොවන අයුරින් ඒ දේවල් කිරීමට ඉඩ දෙන ලෙසත්, මේ අවුරුදු කාලෙත් නිසාත්, ජීවන වියදමත් වැඩි වී ඇති මොහොතක ඒ කටයුත්ත කිරීමට ඉඩ දෙන ලෙසත්, පාර ක්ලීය කර ගැනීමට පොලිසිය දැන ගත යුතු බවත්, පදික වෙළෙන්දන්ට අසාධාරණයක් නොවිය යුතු

බවත්, අසාධාරණයක් කර අවුරුදු කිරිබත් කෑ නොහැකි බවත්, සියල්ලොම ගම්වල මිනිසුන් බවත්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා ප්‍රකාශ කළේය.

ඒ අනුව සංශෝධිත යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**01(x) ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා**

ගැටහැත්ත බහු කාර්යය ගොඩනැගිල්ල තුළ පවතින සෞඛ්‍ය උපකරණ වලින් කොටසක් සබරගමුව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවෙන් 2024.08.23 දින තක්සේරු කර ඇති අතර ඉතිරි කොටස කොළඹ ජීව වෛද්‍ය ඉංජිනේරු ඒකකය මගින් පත් කිරීම් සිදු කරන ලද ජීව වෛද්‍ය ඉංජිනේරු හා එම කමිටුව විසින් 2025.12.26 වන දින තක්සේරු කරඇත.

එමෙන්ම එහි ජීව වෛද්‍ය උපකරණ ලෙස තක්සේරු කළ නොහැකි බවට නිර්දේශයක් සහිත හා වෛද්‍ය උපකරණ ලෙස නැවත යොදා ගත නොහැකි ලෙසට සඳහන් කර ලෝහ බරට වෙන්දේසි කිරීමට නිර්දේශ කර ඇති සෞඛ්‍ය උපකරණ කාර්මික සංවර්ධන මණ්ඩලයෙන් ලෝහ බරට මිලට ගැනීමට එකඟත්වය පළ කර ඇත.

එබැවින් ඇමුණුම් අංක i උප ලේඛනයේ සඳහන් උපකරණයන් හි වෙන්දේසි කිරීමට අදාළ තක්සේරු මුදල පිළිගැනීමටත් ඒවා ප්‍රසිද්ධ වෙන්දේසි කිරීමටත් වෙන්දේසි නොකළ යුතු උපකරණ හා වෙන්දේසියේ දී වෙන්දේසි නොවන උපකරණ කාර්මික සංවර්ධන මණ්ඩලයට ලෝහ බරට විකිණීම සඳහාත් සුදුසු බවට යෝජනා කරමි.

1.ගරු ප්‍රාදේශීය සභා සභාපති බන්දුලසේනදුණුවිල මැතිතුමා.
2.ගරු ප්‍රාදේශීය සභා උපසභාපති යු.ඒල්.ඒන්.මහේෂ් රත්නායක මැතිතුමා.
3.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ඩී.නිරෝෂිකා කැලුම්සිරි මැතිණිය.
4.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ඩිල්ෂාන් කාවින්ද මැතිතුමා.
5.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒම්.ඒම්.මුන්සීර් මැතිතුමා.

} සංශෝධිත යෝජනාවට අත්සන් කළ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන්.

මෙම යෝජනාව උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා**

මේ පිලිබඳව සියලුම මන්ත්‍රිවරු දන්නා බවත්, මේවන විට ගැටහැත්ත බහුකාර්ය ගොඩනැගිල්ල බදු දී ඇති බවත්, ඒ බඩු මේවන විටත් ඉවත් කර නොමැති බවත්, මේ වෛද්‍ය උපකර්ණ කීවට මේවා ඉවතලන ඒවා බවත්, ඒ නිසා මෙය වෙන්දේසි කරන බවත්, වෙන්දේසි කිරීමට නොහැකි වුණොත් ඒවා ලොහ බරට ගැනීමට කාර්මික සංවර්ධන මන්ඩලය ඒකඟ වු බවත්, ඇමුණ 1 යටතේ භාණ්ඩ ලිස්ට් එක දක්වා ඇති බවත්, ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන්නට විය.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**01 (xi) ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා**

2026 වර්ෂයට නියමිත වරිපනම් බදු ලේඛන ලිවීම, තක්සේරු දැන්වීම් ලිවීම, තක්සේරු දැන්වීම් පරීක්ෂා කිරීම, තක්සේරු දැන්වීම් බෙදීම,වෙනුවෙන් පා.පා.කො. චක්‍රෙල්ඛ අංකCLG/LG/1/5/2018/14 හා 2018.12.13 දිනැති චක්‍රෙල්ක අනුව පහත සඳහන් පරිදි සභා අරමුදලින් ගෙවීම් කිරීමට සුදුසු බවට යෝජනා කරමි.

| | නම | කාරණය | ඒකක/පෝරම ගණන | ඒකකයට/පෝරමයට ගෙවන මුදල | ගෙවිය යුතු මුද |
|---|---|---|---|---|---|
| 01 | P.S.A.S.සෝමරත්න මි | වරිපනම් තක්සේරු දැන්වීම් ලිවීම | 7460 | රු.2.00 | රු.14920.00 |
| 02 | U.G.D.W.උඩගෙදර මි | වරිපනම් තක්සේරු දැන්වීම් බෙ | 6440 | රු.8.00 | රු.51520.00 |
| 03 | W.P.C. ප්‍රියශාන්ත මයා | අක්කර බදු තක්සේරු දැන්වීම් ලිවීම | 368 | රු.4.00 | රු.1472.00 |
| 04 | P.S.A.S.සෝමරත්න මි | අක්කර බදු දැන්වීම් පරීක්ෂා කිරීම | 368 | රු.2.00 | රු.736.00 |
| 05 | චන්දිමා ප්‍රියදර්ශනි මිය | අක්කර බදු ලේඛන ලිවීම | 368 | රු.2.00 | රු.736.00 |

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**02 (i) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්. එල්.ජයසේකර මැතිතුමා**

හිඳුරංගල තැපැල් කාර්යාලය අසල හරස් මාර්ගයේ නැඳුන් රජමහා විහාර පාරට පිවිසෙන T හන්දිය බෝක්කුවක් දමා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්. එල්.ජයසේකර මැතිතුමා**

කාණුව අබලන් වී ඇති බැවින් වතුර පාර බැස යෑම සඳහා හියුම් පයිප්ප යොදා හෝ එය සකසා දෙන ලෙස ඉල්ලීමක් කරන ලදී.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**03 (i) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි. එච්.රණවීර මැතිතුමා**

ගැටහැත්ත පොළ භූමියේ සෞඛ්‍ය ආරක්ෂාව වෙනුවෙන් පොළ භූමිය වටා දැල් ආවරණයක් යෙදීම සුදුසු බවට යෝජනා කරමි.

මෙම යෝජනාව උප සභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි. එච්.රණවීර මැතිතුමා**

පොල වටේම කැලෑවක් පවතින බැවින් හරක් බල්ලො වගේ සතුන් පැමිණෙන බවත්, පොළ භූමියේ එකතු වන අපද්‍රව්‍ය කැලෑවට දමන බවත්, ඒම නිසා දැල් ආවරණයක් ගසා පොළ භූමියේ ආරක්ෂාව සලසා දෙන ලෙස ඉල්ලීමක් කළේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා**

ගරු රණවීර මන්ත්‍රීතුමාගේ කතාවෙන් පොළ වටා කැලෑ වැවී ඇති බව ආනාවරණය වන බවත්, එය සුද්ද කර ගන්නා ලෙස ඒ අයට දැන්වීමක් දුන්න නම් හොඳයි කියා ජනතාවගේ සෞඛ්‍ය සම්බන්ධව සභාවට බලයක් තිබෙන බැවින් ඒය ක්‍රියාත්මක කරන ලෙසට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා**

පාරේ ගැවසෙන හරක් ඒ පොළ භූමියට යන බැවින් ඒම ස්ථානය පිරිසිදු නොමැත් බවත්, ඒය සම්පූර්ණ සුද්ද පවිත්‍ර කර පිරිසිදු තැනක් බවට පත් කළ යුතු බවත්, එම ස්ථානයේ අශෝබන තත්ත්වයක් පවතින බවත්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**03 (ii) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි. එච්.රණවීර මැතිතුමා**

දිවුරුම්පිටිය ප්‍රජා ජල යෝජනා ක්‍රමයේ ළිඳ හා ජල ටැංකිය අයත් භූමිය සභාවට පවරා ගැනිම සුදුසු යැයි යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්. අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි. එච්.රණවීර මැතිතුමා**

එම ඉඩමේ දිවුරුම්පිටිය ප්‍රජා ජල යෝජනා ක්‍රමයේ ළිඳ හා ජල ටැංකිය තිබෙන බවත්, ළිඳ හා ටැංකිය යන දෙකම සභාවට පවරා ගෙන නොමැති බවත්, මෙය සභාවට පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කරන ලෙසට ගරු රණවීර මන්ත්‍රීතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා**

එම ඉඩමේ පොදුවේ පවතින අඩි පාරක් තිබෙන බව ප්‍රදේශවාසීන් ප්‍රකාශ කළ බවත්, මේදිනවල ලොකු ජල හිඟයක් පවතින බවත්, ඔවුන් මේ ළිඳ වැඩි වැඩියෙන් පරිහරණය කළ බව ප්‍රකාශ කළ බවත්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා ප්‍රකාශ කරන ලදී.

යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**04 (i) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ඩී. නිරෝෂිකා කැළුම්සිරි මැතිණිය**

මින්නාන වසමට අඩුපාඩුවක්ව පවතින බහුකාර්ය ගොඩනැගිල්ලක අවශ්‍යතාවය සඳහා ප්‍රාදේශීය සභාවට අයත් මින්නාන පැරණි අම්බලම ගොඩනැගිල්ලේ ඉහළ මහලය සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩී.ගයානි බුද්ධිකා මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

**ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා**

මේ යෝජනාව සභා අරමුදලින් කරන යෝජනාවක් නොවන බව ප්‍රකාශ කළා.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනිඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණිය**

මෙය සභා අරමුදලින් කරන්න කළ ඉල්ලීමක් නොවන බවත්, ප්‍රජා ශක්ති වැඩසටහනට ඇතුළත් කර ඇති බවත්, සභාවට අයත් ගොඩනැගිල්ලක් බැවින් සභා අනුමැතිය ගැනීමට අවශ්‍ය නිසා සභාවට යොමු කළ බවත්, ඒ සඳහා අනුමැතිය ලබා දෙන මෙන් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනි ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණිය විසින් ඉල්ලීමක් කරන ලදී.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා**

මින්නාන පැරණි අම්බලම ගොඩනැගිල්ල තමන් කුඩා කල ළමුන්ගේ බර කිරීම සභා භාවිතා කළ බවත්, මේ වනවිට මේ ස්ථානය වල්බිහි වී අක්‍රිය තත්ත්වයේ පවතින බවත්, එම ගොඩනැගිල්ල බහු කාර්ය ගොඩනැගිල්ලක් ලෙස සංවර්ධයන කිරීම මින්නාන ගමට ඉතා වටිනා ස්ථානයක් බවට පත්වන බවත්,ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා විසින් වැඩිදුරටත් ප්‍රකාශ කැන ලදී.

යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**05(i) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්. එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා**

අංක 139 A නැ/කලටුවාව ග්‍රාම නිලධාරී වසමේ මාරඹේ කන්ද යන ගමෙහි පිහිටි නාරංගහඕවිට ඉඩම ක්‍රීඩාපිටියක් සඳහා සභාවට පවරා ගැනිම සුදුසු බවට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අයි. එච්.රණවීර මැතිතුමාවිසින් ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්. එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා**

ගැටහැත්ත සිට නාපාවල දක්වාම ක්‍රීඩාපිටියක අවශ්‍යතාවය පවතින බවත්, එම අවශයතාවය සපුරා ගැනීමට එම ඉඩම් හිමිකරු විසින් ඉඩමෙන් අක්කරයක් ලබා දීමට කැමැත්ත ප්‍රකාශ කර ඇති බවත්, අක්කරයෙන් කොටසක් යෞවන සමාජයකට හිමි කොටසකුත් පවතින බවත්, සබරගමුවේ රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට කෝරලයේ ඇහැලියගොඩ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවට අයත් අංක 139 A නැ/කලටුවාව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මාරඹේ කන්ද යන ගමෙහි පිහිටි නාරංගහඕවිට ඉඩම අක්කරයක පමණ කොටසක් පවතින බවත්,එමඅක්කරයක පමණ කොටසින් කොටසක් යෞවන සමාජය පවරා ඇති අතර, දැනටත් යෞවන සමාජය විසින් පරිහරණය කරන බවත්, තව කොටස් කිපයක් ලබා දීමට ඉඩම් හිමියා කැමැත්ත ප්‍රකාශ කර ඇති බවත්, එමනිසා මෙය සභාවට පවරා ගෙන අත්‍යවශ්‍ය කාරණයක් ලෙස සලකා බලා මෙය ක්‍රීඩාපිටියක් දක්වා සංවර්ධනය කර දෙන ලෙසට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්. එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා විසින් ඉල්ලීමක් කරන අතර මෙය සභා යෝජනාවක් ලෙස සම්මත වු විට අත්පත් කර ගැනිමේ කටයුතු සඳහා යොමුවිය හැකි බවත් ඒතුමා වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා**

මෙය යෞවන සමාජයත් සමඟ ඒකාබද්ධවී කිරිම සුදුසු බව ප්‍රකාශ කළා.

යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**06 (i) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා**

මින්නාන නන්දසිරි ක්‍රීඩාපිටියට අයත් ඉඩම ප්‍රාදේශිය සභාවට පවරා ගැනිමට කටයුතු කිරීම සුදුසු බවට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමාවිසින් ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීඑච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා**

ගමේ බොහෝ දෙනා මෙය ක්‍රීඩාපිටියක් හා පොදු වැඩ සඳහා පවත්වාගෙන ගියත් මෙය සභාවට පවරා ගෙන නොමැති හෙයින් මෙය සභාවට පවරා ගැනීමට කටයුතු කරන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීඑච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.
යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**07 (i) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීඩබ්ලිව්. සමන්සිරි විජේසිංහ මැතිතුමා**
නාගරුක්කාරාමය අසල පොදු නාන ළිඳ අලුත්වැඩියා කිරීම සුදුසු බවට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එම්.එම්. මුන්සීර් මැතිතුමාවිසින් ස්ථිර කරන ලදී.

**ගරු සභාපති බන්ධුලසේන දූණුවිල මැතිතුමා**

මෙය විශාල මුදලක් යෙදවිය යුතු වැඩක් නොවන බවත්, පසුගිය දිනවල සුද්ද පවිත්‍ර කළ බවත් ප්‍රකාශ කරන්නට විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය**

මෙම ඉඩමට ඒ කාලයේ සිට අයිතිකාරයෙක් නොසිටිය බවත්, එක එක්කෙනා බුක්ති වින්ද බවත්, අවුරුදු 50 විතර පැරණි ළිඳක් බවත්, දැන් ළිඳ වසා ඇති බවත්, ප්‍රදේශයේ ම පුද්ගලයෙක් තමන්ගේ වගේ අයිති කර ගෙන සිටින බවත්, පුංචියට හරි සමිති ශාලාවක් සාදා දෙන ලෙසට ගම්වාසීන්ගේ ඉල්ලීමක් තිබෙන බවත්, හොරගොඩ ප්‍රදේශයට පොදු ස්ථානයක් නොමැති බවත්, එම භූමිය ඉහළගම වසමට අයිති වුණත්, එම ඉඩම ගොඩක් සමීප හොරගොඩ වසම බවත්, මෙය සභාවට අත්පත් කර ගැනිමට හැකියාවක් පවතිනවා නම් සභාවට අත්පත් කර ගෙන පොදු වැඩකට යොදා ගැනීමට හැකි නම් හොඳ බවත්, ගරු ප්‍රාදේශීය සභාමන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.

**ගරු සභාපති බන්ධුලසේන දූණුවිල මැතිතුමා**

ගරු නාගරුක්කාරාම ස්වාමීන් වහන්සේ මේ සඳහා මැදිහත් වීමක් වීමට කැමැත්ත ප්‍රකාශ කළ බවත්, ඒ හරහා පවරා ගැනීම් කර ගැනීමට හැකි ද යන්නත් සොයා බලමු යනුවෙන් ගරු සභාපති බන්ධුලසේන දූණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කළේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්ලිව්. සමන්සිරි විජේසිංහ මැතිතුමා**

ගරු ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මන්ත්‍රීතුමිය කියූ පරිදි ළිඳ දැනට වසා තිබෙන බවත්, අත්පත් කර ගැනීමකට ගොස් ආරවුල් ඇති කර ගැනීමට අකමැති වූ විට, ඒහි අයිතිය අරන් දීමට ස්වාමීන් වහන්සේ භාර ගැනීමට පොරොන්දු වූ බවත්, එය නිරවුල් කළ විට ප්‍රතිපාදන වෙන් කළොත් ඒය සදා ගැනීමට හැකි බවත්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීඩබ්ලිව්. සමන්සිරි විජේසිංහ මැතිතුමා ප්‍රකාශ කරන ලදී.

යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**(උ)කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම.**

| | | |
|---|---|---|
| i. | මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තා. | - ඇමුණුම් ලේඛනය ii/iii/iv |
| ii. | මිලදී ගැනීම් සම්බන්ධ ප්‍රසම්පාදන කාරක සභා රැස්වීම් වාර්තා. | - ඇමුණුම් ලේඛනය v/vi/vii |
| iii. | කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තා. | - ඇමුණුම් ලේඛනය viii/xiv |
| iv. | නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව. | - ඇමුණුම් ලේඛනය ix |
| v. | පරිසර හාපොදු පහසුකම් කාරක සභා රැස්වීම් වාර්තාව. | - ඇමුණුම් ලේඛනය x |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමනි, 2026.03.24 මුදල් කාරක සභා වාර්තාවේ තුන්වෙනි පිටුවේ සඳහන් වෙන,

1.කාරක සාභා පවතින තත්ත්වයට වඩා සක්‍රීය විය යුතු ය.ඒවායේ ප්‍රගතිය බැලිය යුතුය.එසේ නොමැති වුවහොත් පැමිණිලිවලට විසඳුම් නොලැබේ.

2. මුදල් වෙන් කරනු ලබන්නේ කුමන සවර්ධන යෝජනා ක්‍රමවලට දැයි මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටුවේ දී තීරණය කර,ඒ හරහා සංවර්ධන යෝජනා පෙළ ගස්වා ප්‍රමුඛතාවය මත ඒවා ක්‍රියාත්මක කළ යුතු බව,

3. සභාවේ ගත් තීරණයක් තීරණයක් ක්‍රියාත්මක නොවුනහොත් එය ගැටළුවක් වන බැවින්, සභාවට ඉදිරිපත් කිරීමට පෙර මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවට යෝජනා ඉදිරිපත් කර ඉන් පසුව සභාවට ඉදිරිපත් කිරීම සුදුසු බව,

4. සංවර්ධන යෝජනා ඉදිරිපත් කිරීම සම්බන්ධව ඒකාබද්ධ කාරක සභාවක් කැඳවා මන්ත්‍රීවරුන් සියලුම දෙනා ම දැනුවත් කළ යුතු බව,

5. මන්ත්‍රිවරුන්ට සභා කටයුතු පිළිබඳ පුහුණුවක් ලබා දිය යුතුබව.

යන කරුණු පහ සම්බන්ධව ඉදිරියේ දී ගන්න ක්‍රියාමාර්ග මොනවද යන්න දැන ගැනීමට කැමති බව ප්‍රකාශ කරන ලදී.

**ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මතිතුමා**

ගරු මන්ත්‍රිතුමා, ඒ සම්බන්ධව ඉදිරියේදී ක්‍රියාමාර්ග ගැනිමට සිදුවන බවත්, මේතෙක් ඒවැනි ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවත්, අපි ඉදිරියේ දී මේ කාරණා මත ප්‍රගතිය හා මන්ත්‍රීවරුන්ට පුහුණුව ලබා දීම,වැනි කටයුතු සඳහා යොමු වන බවත් ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමනි, 2026.03.06 දින ප්‍රසම්පාදන කාරක සභා වාර්තාවේ අංක 3 යටතේ සඳහන් ප්‍රාදේශිය සභා බිම් මහල වෙළඳ සංකීරණය සඳහා අවශ්‍ය දැන්වීම් පුවරු සකස් කරවා ගැනීම සම්බන්ධ කාරණාව පිළිබඳව තමාට මතකයක් නොමැති බව සඳහන් කළේය.

**ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මතිතුමා**

ගරු මන්ත්‍රිතුමා,ප්‍රාදේශිය සභා බිම් මහල වෙළඳ සංකීරණය සඳහා අවශ්‍ය දැන්වීම් පුවරු සකස් කරවා ගැනීම සම්බන්ධ කාරණාව සම්බන්ධය ඊළඟ කාරක සභා රැස්වීමකදී තවදුරටත් සාකච්ඡා කරමු යනුවෙන් පවසන ලදී.

**ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මතිතුමා**

**(උ)ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කළ යුතු වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම.**

i. 2026මාර්තුමස ආදායම් වියදම් වාර්තාව. - ඇමුණුම් ලේඛනය xi
ii. 2026මාර්තු මස හිඟ ආදායම් වාර්තාව. - ඇමුණුම් ලේඛනය xii

**ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මතිතුමා**

**(ඌ)සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලි කිරීම.**

එක මන්ත්‍රිවරයෙක් එක් අවස්ථාවක් පමණක් ලබා ගන්න.ඒ වගේ ම මං මේක අවස්ථාවක් කර ගන්නවා, මං ආනතුරකට ලක් වුණු අවස්ථාවේදී, පක්ෂ විපක්ෂ කියලා භේදයකින් තොරව, දුරකතනයෙන් කතා කරලා සුවදුක් විමසුවා.තවත් පිරිසක් නිවසට ම පැමිණියා.ඒ සියලු දෙනාටම ස්තුතිය ප්‍රකාශ කරන්න මම මේක අවස්ථාවක් කර ගන්නවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.පී.ජේ.පී.හිරිපිටියමැතිතුමා**

ගරු සභාපතිතුමනි, මින්නාන ඉද්දමල්ගොඩ පාරේ තියෙනවා මින්නාන හෝම් ගාර්ඩ්න් යනුවෙන් ඡයා රූප ලබා ගැනීම සඳහා ස්ථානයත් පවත්වාගෙන යන බවත්, එම ස්ථානය මේ වන විට විවිධ උත්සව පැවැත්වීමට භාවිතා කරන බවත්,ඒ අවට අයට ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතය නිසා ගම්වැසියන්ටකරදරකාරී බව දන්වමින් තමාට ඒ සම්බන්ධව දැනුවත් කළ බවත්, සභාපතිතුමාටත් ලිපියක් මඟින් දැනුවත් කිරීමක් කිරීමට ගම්වැසියන් සූදානම් බවත්, මෙම ආයතනය පවත්වා ගෙන යෑම සඳහා නිසි අවසර ලබා ගෙන ද යන්න ගම් වැසියන් විමසන බවත්, ඒ පිළිබඳ සොයා බලා කටයුතු කරන්න කියලා තමන් ගරු සභාපති බන්ධුලසේන දූණුවිල මතිතුමා වෙත ඉල්ලීම් කරන බවත්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා**

ගරු සභාපතිතුමනි, 2026.04.07 සභා න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සඳහායෝජනාවක් ඉදිරිපත් කළ බවත්, නමුත් එම යෝජනාව ප්‍රතිෂේප වී ඇති බවත්, ඇහැලියගොඩට ගව ඝාතාකාගාරයක් නොමැති බවත්, ඒ නිසා ගව ඝාතකාගාරයක් ලබාදීමට කටයුතු කරන ලෙස ඉල්ලමින් යෝජනාව ඉදිරිපත් කළ බවත්, ඇහැලියගොඩට අවශ්‍ය මස් කුරුවිටින් ප්‍රවාහනය කිරීමට සිදුව ඇති බවත් , ඒ සඳහා විශාල ප්‍රවාහන කුලියක් දැරීමට සිදු වන බවත් , පැහැදිලි කරන ලදී.ඇහැලියගොඩ සභාවට ලොකුම ආදායමක් ලැබෙන්නේ දැනට ක්‍රියාත්මක ඇහැලියයගොඩ මස් කඩේින් බවත්, එම නිසා ඇහැලියගොඩට ගවව ඝාතකාගාරයක් අත්‍යවශ්‍ය බවත්, මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා සමඟ මේ පිළිබඳ කතා කළ බවත්, එතුමා ද සභාවට යෝජනාවක් කරන ලෙස ප්‍රකාශ කළ බවත්,ප්‍රකාශ කරන ලදී.කුරුවිටින් ගෙන්නන මස් කොහෙන් ගේනවද කියා නෙදන්නා බවත් ,මහජනතාවගේ අවශ්‍යතා ගැන සැලකිලිමත් විය යුතු බවත්, මස් කිලෝ එකක් මේ වන විට රුපියල් 3000.00 ක් පමණ මිළක් වන බවත් සඳහන් කළේය.සභාවට ආදායම් උත්පාදන යෝජනාවක් ලෙස මෙය ක්‍රියාත්මක කළ හැකිබවත් ප්‍රකාශ කර සිටියේය.

**ගරු සභාපති බන්ධුලසේන දූණුවිල මතිතුමා**

ගරු මන්ත්‍රිතුමා, ගව ඝාතකාරයක් ස්ථාපිත කරන්න ස්ථානයක් සොයා ගන්න පුළුවන්ද යන්න විමසන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා**

ගරු සභාපතිතුමනි,ඒ සඳහා ස්ථානයක් සොයා දිමට හැකි බවත්, phi නිළධාරී මහතුන් සමඟ කතා කර හැකි නම් ඒමකටයුත්ත කර ලෙස ඔබතුමාගෙන් ඉල්ලා සිටින බවත්, මෙය මුදල් වැය වෙන යෝජනාවක් නොවන අතර, ඒ සඳහා අවසර ලබා දෙනව නම් මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන්ගේ උපදෙස් පරිදි ඒ කටයුත්ත කරන්න පුළුවන් බවත්, මුන්සීර් මන්ත්‍රීතුමත් සමඟත් මේ ගැන කතා කළ බවත්, එතුමාද මෙය වැදගත් යෝජනාවක බවට ප්‍රකාශ කළ බවත්, මෙය අනිවාර්යෙන්මසභා යෝජනාවක් ලෙස ලබා දෙන ලෙසට ප්‍රකාශ කළ බවත් ප්‍රකාශ කළේය.තමා හා මුන්සීර් මන්ත්‍රිතුමා පමණක් මේ සම්බන්ධව කතා කරන්න සිටියත් ගව මස් බොහෝ දෙනෙක් ආහාරයට ගන්නා බව ප්‍රකාශ කළේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා**

ගරු සභාපතිතුමනි, න්‍යාය පත්‍රය සැකසිම සඳහා යෝජනා තේරීමේදී යම් නිශ්චිත ක්‍රමවේදයකට ඒ දෙය කළ යුතු බවත්, කියා සිටියේය.අපි යෝජනාවක් ඉදිරිපත් කරනවා පාරක් කැඩුණු එකක් ගැන.එය මෙහෙට අත්‍යවශ්‍ය නොවෙන්න පුලුවන්.නමුත් එය ගමට අත්‍යවශ්‍යයි.ගමට අත්‍යවශ්‍යයි, ප්‍රතිපාදන නැති නිසා අත්‍යවශ්‍ය නැති වෙනවා.මම යෝජනා කරලා තියෙනවා.උදාහරණයක් විදිහට, අමුහේන පාලම මම යෝජනා කරලා තියෙනවා, ඒ අමුහේන පාලම උඩින් තමයි කසල අංගනයට ට්‍රැක්ටර් යන්නේ.ඒ පාරෙ පැත්තකින් ලොකු වලවල් හැදිලා තියෙනවා.ඒක ඉක්මනින් සංවර්ධනය කළේ නැත්නම් ඒ පාර තව කැඩී කැඩී යනවා.අන්න එතනදී ඔබතුමාවත් ලේකම්තුමාවත් ඒ පාලම දැකලා නෑ, කැඩිල ද නැද්ද කියන්න. එහෙම නම් මේ යෝජනා න්‍යාය පත්‍රයට යොමු කරන්න කලින් සුදුසු ද නැද්ද කියලා තීරණය කරන්න අධීක්ෂණය කිරීමට ඒ ස්ථානවලට යෑමට සිදුවන බවත් ප්‍රකාශ කරන ලදී.ඒ නිසා යෝජනා ප්‍රතික්ෂේප කිරීමේ ක්‍රියාවලියට කුමක් හෝ වැඩපිළිවෙලක් යොදන්න කියලා ප්‍රකාශ කළා.

වීථි සුනඛයින් මේ වන විට විශාල වහයෙන් වැඩි වී ඇති බවත්, එය පාලනය කිරිමට කුමක් හෝ වැඩපිළිවෙලක් සැකසිය යුතු බවත්, නැතහොත් සුනඛයින් මාර්ගවලට මුදා හරින පුද්ගලයින්ට එරෙහිව යම්කිසි දඩයක් ගැසීමට කටයුතු කළ යුතු බවත්, එවැනි වැඩපිළිවෙළකටවත් යායුතු බව ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමනි, නව වැඩබලන ලේකම්තුමා විසින් න්‍යාය පත්‍ර සැකසීම සම්බන්ධව ගෙන ඇති ක්‍රියාමාර්ගය සුදුසුයි කියලා පිළි ගන්නා බවත්, අවුරුදු උත්සව කාලයේ නව හා පැරණි පොළ භූමිය 2026.04.01 සිට 2026.04..15 දක්වා තාවකාලිකව කඩකාමර සඳහා බදු දීමට ගත් යෝජනාව ගියවර සභාවට යෝමු කිරීමට කටයුතු කර තිබුණා නම් හොඳ බවත් ප්‍රකාශ කරන්නට විය.සභාපතිතුමා ඇතුළු සභාවේ පක්ෂ විපක්ෂ සියළුම මන්ත්‍රිවරියන්ට මන්ත්‍රිවරුන්ට ද සභා ලේකම් ඇතුළු සභාවේ නිලධාරී මණ්ඩලයට ද රෝගී වී සිටින ලේකම්තුමාටද නිදුක් නිරෝගී සුවය ප්‍රාර්ථනා කරන අතර ම, ලබන්නා වූ සිංහල හා හින්දු අලුත් අවුරුද්ද නිදුක් නිරෝගී සම්පන්න වාසනාවන්ත අලුත් අවුරුද්දක් වේවා කියා ප්‍රාර්ථනා කරන ලදී.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මීට මාසකිපයකට උඩදී බුළුගහපිටිය හාල්පාන්දෙනිය කුඹුර මැද්දෙන් දෙපාවෙල්ල වෙනුවට වෙනත් මාර්ගයක් ඉදි කිරීම සම්බන්ධවත්, හාල්පන්දෙනිය කුඹුර අසලින් සෙනවිරත්න මහතාගේ නිවසට යන පාර සම්බන්ධව කළ ව්‍යාපෘතිය අදාළව හිටපු ලේකම්තුමාට ලිපියක් භාර දුන් බවත්, එම ලිපියසම්බන්ධව සාධාරනයක් කරන ලෙස ඉල්ලීමක් කළ බවත්, කාර්මික නිලධාරී මහතෙකු යොමු කර ඒ සඳහා අවශ්‍ය කටයුතු කර දෙන ලෙසට සභාවේදී ඉල්ලීමක් කරන ලදී.

කසල අංගනයේ මුරකරු වශයෙන් සේවයේ යෙදෙන නිලධාරියා තම රාජකාරිය නිසිලෙස ඉටු නොකරන බව විෂය නිලධාරිනිය විසින් තමන්ට කීපවතාවක් ම ප්‍රකාශ කළ බවත්, එසේ තම රාජකාරිය නිසි ලෙස ඉටු කිරීමට නොහැකි නිලධාරීන් රාජකාරියේ යොදවා ගැනීම නිෂ්පල කටයුත්තක් බවත්, එම රාජකාරිය සිදු කිරිමට වෙනත් පුද්ගලයින් ඕන තරම් සිටින බවත් ප්‍රකාශ කරන්නට විය.

සෞඛ්‍ය සේවකයින් යකඩ එකතු කර එම යකඩ විකුණනවා කියලා කියා තියෙන බවත්, එම නිසා ඒ සම්බන්ධව ආයතන දැනුවත් කිරීමට කටයුතු කළ යුතු බවට පරිසර හා පොදු පහසුකම් කාරක සභාවේ සභාපති වශයෙන් කටයුතු කරක ගරු පී.ඩිල්ශාන් කාවින්ද මන්ත්‍රිතුමා ප්‍රකාශ කළ බවත්, වැඩ කරන කම්කරුවන් අපිට හදා ගැනිමට නොහැකි නම් වෙන ආයතන දැනුවත් කිරීම වැඩක් නැති බවත්, මුරකරුවා සම්බන්ධව හා යකඩ විකිණීම සම්බන්ධවද කුමක් හෝ තිරණයක් ගත යුතු බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී ඩී.ගයානි බුද්ධිකා මැතිණිය**

බෝපැත්ත දිද්ද කොට්ඨාශයේ සුසාන භූමිය සංවර්ධනය කිරිමේ ව්‍යාපාතිය බෝපැත්ත දිද්ද කොට්ඨාශයට ලැබුණු බවත්, සුසාන භූමියේ වල් බිහිවීම වලක්වාගෙන එය ක්‍රමවත්ව පවත්ව පවත්ගෙන යෑම පරිසර මිතුරෝ සමිතිය හා මරණාධාර සමිතිය යන සමිති දෙක ම ඒකඟ වූ බව යෝජනාව ඉදිරිපත් කරන අවස්ථාවේ තමා ප්‍රකාශ කල බවත්, තමා ලඟ ඇස්තමේන්තු ඇති බවත් පන්ලක්ෂ හතලිස්නව දහසක ව්‍යාපෘතියක් සිදු කල බවත්, තමා මුලින් කිවු පරිදි ඒම සමිති දෙක ඒම ක්‍රම වෙදයට අනුගත වී සුසාන භූමිය සුද්ද කිරීමේ කටයුතු සිදු කරමින් වල්බිහිවීම වලක්වා ගැනීම සඳහා ගමේ පිරිසගේ ද සහයෝගය ඇතුව ඒ කටයුතු සිදු කල බවත්, රජයක් විදිහට බලාපොරොත්තු වූ වෙනස ඒය බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී ඩී.ගයානි බුද්ධිකා මැතිණිය විසින් ප්‍රකාශ කරන්නට විය.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා**

සභා න්‍යාය පත්‍රය සඳහා යෝජනා තුනක් ඉදිරිපත් කළ බවත්, එම යෝජනා ප්‍රතික්ෂේප කර ඇති බවත්, එම යෝජනා අතර විථි සුනකයින් ඉවත් කිරිම සම්බන්ධ යෝජනාක් ඉදිරිපත් කළ බවත්, මහජන සෞඛ්‍ය මහතුන් වෛද්‍ය නිලධාරී මහතා සම්බන්ධ කර ගෙන මේ පිළිබඳ පැහැදිලි කිරීමක් කල බවත්, ඒහිදි විථි සුනඛයින් ඉවත් කළ යුතු බවට තීරණය වූ බවත්, ඒහිදී වන්ද්‍යාකරණය කළ යුතු හෝ ඇඹිලිපිටිය ප්‍රදේශයේ

පවතින සුනඛ සුරක්ෂිත මධ්‍යස්ථානට යොමු කළ යුතු බවට තීරණය වු බවත්, මේ සඳහා පරිසර සංවිධාන හරහා මුදලක් වැය නොකර ක්‍රයාමාර්ගවලට යැමට හැකි බව විශ්වාසයෙන් යුතුව ප්‍රකාශ කරන බවත්, සුනඛයින්ට බෙහෙත් විදින මොහෙතේ කර පටි දීමේ අදහස් කළේ, උපසභාපතිතුමා මීට කලින් අර්ථකතනය කල ආකාරයට, වීථි සුනඛයින් හා නිවසේ ඇති කරන සුනඛයින් වෙන් කර හඳුනා ගැනීම සඳහා බවත්, සභාවට ආදයමක්ද ඒ සමඟ හඳුනා ගැනීමේ පහසුවක් ලැබෙන බවත්ය.අවසානාවට තමන් ප්‍රතිපාදන නොදෙනව වගේ විලේගොඩ බල්ලන්ට කරපටි ලබා දී නොමැති බවත්, විලේගොඩ ඒන්නත් ලබා දුන් බල්ලන්ට කරපටි ලබා නොදීම හේතුවෙන් සුනඛයින් වෙන් කොට හඳුනා ගත නොහැකි බවත්, ඒ සම්බන්ධව ලේකම්තුමාගේ විශේෂ අවධානය මේ සඳහා යොමු කරන ලෙස ඉල්ලා සිටියේය.

බිසෝදොළ ඇළට කිරි මිශ්‍ර ජලය ඒක් කිරීම පිළිබඳව ගරු සමන්සිරි මන්ත්‍රිතුමා හා තමා මේ සභාව තුළ හඬක් නැගු බවත්, ඒ සම්බන්ධව ස්ථාන පරීක්ෂණයක් කරන බවත්, ඒ සම්බන්ධව යම් ක්‍රියාමාර්ගගැනීමට නියමිත බව ප්‍රකාශ වු බවත්, ඒ පිළිබඳව දැන් පවතින තත්ත්වය කුමක්ද යන්න ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් විමසීමක් කරන ලදී.

ඇහැලියගොඩ පවතින ජල ප්‍රශ්නය පිළිබඳව තමන් නිතරම ප්‍රශ්න කරන බවත්, තලාවිටිය ජල යෝජනා ක්‍රමය සම්බන්ධව තමා මංගල සභාවේ දී යෝජනාවක් ලෙස ඉදිපත් කළ විට. කෙටි කාලයක් තුළ ඒම කටයුත්ත නිමකරන බව ඒ අවස්ථාවේ පැවසු බවත්, ඒ සම්බන්ධවත් ඍජු පිලිතුරක් බලා පොරොත්තු වන බවත්, ප්‍රකාශ කළේය.

සම්බන්ධීකරණ රැස්විමේදී ගරු ආරියදාස මන්ත්‍රිතුමා ප්‍රකාශ කලා සේවා පියසක් සඳහා ඉඩමක් ලබා දෙන ලෙස ප්‍රකාශ කළ බවත්, ඒ අවස්ථාවේ පහළගම වසමේ ඉඩමක් යෝජනා කළ බවත්, සභාපතිතුමා ඒ අවස්ථාවේ යකුදාගොඩ සුසාන භූමියට අයිති භූමියෙන් කොටසක් ලබා දෙන ලෙස ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මතිතුමා යෝජනා කළ බවත්, ඒකට එකඟතාවය ලබා දුන් බවත්, ඒ පූර්වාදර්ශය අනුව ඇහැලියගොඩ ජාතික පාසලේ නිරන්තරව පැන නගින ඉඩම් ප්‍රශ්නය ඒ අනුව පාසලට නිදහස් කර දෙන ලෙස තමා ඉල්ලා සිටිමින් තමා හදිසි යෝජනාවක් ලෙස මේ සභාවට අද දින ලබා දුන් බවත්, යකුදාගොඩ බලප්‍රදේශයෙන් ඒ ආකාරයට ඉඩම් කොටස ලබා දෙන්න හැකි නම්, සියලු දෙනාටම ඍජුව බලපාන විශාල පිරිසක් අධ්‍යාපනය ලබන, ආදි ශිෂයන් විශාල පිරිසක් මේ සභාව නියෝජනය කරන, ආදි ශිෂ්‍ය සංගමයේ බහුතරයක් මේ රජය ගොඩ නගන්න විශාල කැප කිරීමක් කළ බවත්, අවසන් ගැටුව පවතින්නේ මේ කොටස් දෙක අතර බවත්, එයට විසඳුමක් වශයෙනුත්, ඉහත පූර්වාදර්ශය ක්‍රියාත්මක කරන ලෙස තමා දැඩිව ඉල්ලීමක් කරන බවත්, ඒ සඳහා විශේෂ අවදානය සමඟ ක්‍රියාත්මක කිරීමේ හැකියාව ලැබෙන ලෙසට ප්‍රාර්ථනා කරන බවත්, පවතින ආර්ථික අපහසුතා මධ්‍යයේ වුවත් ලබන්නා වු අලුත් අවුරුද්ද සියලු දෙනාටම ලැබෙන විදිහට කාල බීලා ජීවත් වෙන්න හැකියාව ශක්තිය ධෛර්ය නිර්මාණය වෙන ලෙසට ප්‍රාර්ථනා කරන බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

**ගරු සභාපති බන්ධුලසේන දූණුවිල මතිතුමා**

සුනඛ කරපටිය ලබා දීම වසම් 44 ම ආවරණය වන පරිදි පසුගිය කාලේ පුරා ම ක්‍රියාත්මක වු බවත්, ඒ සඳහා සභාවේ නිලධාරීන් සහභාගී වු බවත්, අඩුපාඩු වුණානම් අඩු පාඩු වුණේ වසම් තුනකට වගේ බවත්, එම අඩුපාඩුව පිළි ගන්නා බවත්, බිසෝදොළ ඇල්ල නිරික්ෂණයට ගිය බවත්, උඩවත්තෙන් කිරි මිශ්‍ර ජලය මුදාහරින බව සිතා සිටියත් එය ඒන්නේ උඩ වත්තෙන් නොවන බවත්, ඒම ජලය ගලා ඒන්නේ ඊට මෙහා පවතින කාණු පද්ධතියෙන් බවත්, ඒ අවස්ථාවේ නිරීක්ෂණය වු ආකාරයට කිරි නොවන බවත්, කසිප්පු පෙරා ගෝඩා ජලයට මුසු කරන බවක් පෙනී ගිය බවත්, ඒ සම්බන්ධව ගම්වැසියන් දැනුවත් කළ බවත්, පොලීසියට තොරතුරු ලබා දෙන්න නිශ්චිත තොරතුරක් සොයා ගත නොහැකි වු බවත්,ජලයෝජනා ක්‍රමය සම්බන්ධයෙනුත් කටයුතු කමින් පවතින බවත්, ෆයිල් එකක් එක කාර්යාලයකින් තවත් කාර්යාලයට යැමට සැහෙන කාලයක් යන බවත්, 90% වැඩිය ගැටලුව විසඳී ඇති බවත්, නීත්‍යානුකූල ප්‍රශ්න ටිකක් පවතින බවත්, මුදලුත් ලැබී ඇති බවත්, එය ක්‍රියාත්මක වීම ප්‍රමාද බව තමා පිළී ගන්නා බවත්, පාසල සම්බන්ධව ඔබතුමා ලබා දුන් ලිපිය කියවු බවත් මේ අවස්ථාවේ ලේකම්තුමා සමඟ සාකච්ඡා කළ බවත්, එය හදිසි යෝජනාවක් ලෙස මේ සභාවට නොදා අධ්‍යනය කිරීමකින් පසු කාරක සභාවක් හරහා සාකච්ඡා කල යුතු බවත්, එය කාරක සභාවක් හරහා යොමු කළ යුතු බවත්, ගරු සභාපති බන්ධුලසේන දූණුවිල මතිතුමාවිසින් ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා**

පසුගිය කාලය තුළ සාභාව විසින් කළ වැඩ කොටස් පිළිබඳ බැලු විට සතුටු විය හැකි තත්ත්වයක් පවතින බවත්, ගරු අතුරලිය මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ කාරණා දෙකක් සම්බන්ධව අවධානය යොමු කරන්න කැමති බවත්, ඉන් එකක් වු බිසෝදොළ ඇළට මිශ්‍ර වු කිරි සම්බන්ධව.එම අවස්ථාව නිරීක්ෂණය කිරීමට තමාද සහභාගී වු බවත්, ඇළට මුසු වී ඇත්තේ කිරි නොවන බවත්, කසිප්පු පෙරා ගෝඩා වතුරට එක් කිරීම නිසා මේ තත්ත්වය ඇති වී ඇති බවත්, ඒ පිළිබඳ සොයා බැලීමට කණ්ඩායමක් ගිය බවත්, මේ වන විට ඒ තත්ත්වය නැවතී ඇති බවත් ප්‍රකාශ කරන්නට විය.

සේවා පියසක් පිළිබද ප්‍රකාශ කළ කාරණයේදී, සුසාන භූමිය සභාවට අයිති නැති බවත්, එය රෝහලට අයිති බවත්, එය රෝහලින් නිදහස් කර ගැනීමට අවශ්‍ය බවත්, නමුත් දැන් එම අදහස ඉවත් කරගෙන ඇති බවත්, නමුත් මේවනවිට ඉඩම් දෙකක් ලබා දිමට පුද්ගලයින් දෙදෙනෙකු ඉදිරිපත් වී ඇති බවත්, ඉන් එක් පුද්ගලයෙකු වන්නේ විලේගොඩ පියරත්න මහත්මයා බවත්, ඔහු පර්චස් 10 ක් දීමට සුදානම් වු බවත්, ඉන් පර්චස් 5 ක් නොමිලේ දීමට එකඟ වු බවත්, ඒ සඳහා ගරු සමන්සිරි මන්ත්‍රීතුමාගේ මැදිහත් වීම මත මේ කටයුත්ත සිදු වු බවත්, තවත් ඉඩමක් මැණික් ව්‍යාපාරිකයෙකුත් දෙන්න සුදානම් බවත්, සේවාපියසක් සෑදිමට එම ඉඩම් දෙකෙන් තොරා ගැනීමක් සිදු කරන බවත්, එසේ පරිත්‍යාගශිලින් ඉදිරිපත් වීම සතුටට කාරණයක් බවත්, සේවා පියසි අවශ්‍ය ස්ථාන බලප්‍රදේශය තුළ තව තිබෙන බවත්, පරිත්‍යාගශිලින් සිටිනවා නම් ඒ සඳහා ඉදිරිපත් වෙනවා නම් ඒවා සඳහා ද මැදිහත් වීම් සිදු කරන බවත්, ලබන්නා වු සිංහල හා හින්දු අලුත් අවුරුද්ද යහපත් අවුරුද්දක් වේවා කියා ප්‍රාර්ථනා කරන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා විසින් ප්‍රකාශ කරන්නට විය.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා**

පළවෙනි සභාවාරයේදී දම්මුල්ල පොළ සම්බන්ධව කාතා කළ බවත්, එම ස්ථානයට අදාළ සංවර්ධන ව්‍යපෘති සම්බන්ධව ඉල්ලීම් කළ බවත්, ඒවා බොහොමයක් කර ගැනිමට හැකි වු බවත්, එදා ඒ වසා දමා තිබු වෙලඳ පොළ යථා තත්ත්වයට පත් වී ඇති බවත්, තල්දුව වෙළඳ සංගමය ඒ කාර්ය සාර්ථකව කරගෙන යන බවත්, ග්‍රාමසේවා වසම් 5 ක කුඹුරු වැඩ කරමින් සිටි ජනතාව ඉන් ප්‍රතිලාභ ලබන බවත්, ඒසඳහා සහයෝගය දැක් වු ප්‍රාදේශිය සභා නිලධාරි මහත්ම මහත්මීන්ට හා සභාව නියෝජනය කරන සියලුම මන්ත්‍රී මන්ත්‍රීවරියන්ටත් ග්‍රාමසේවා වසම් පහේම ජනතාව වෙනුවෙන් ගෞරවනීය ස්තුතිය පුද කරන බවත්, ලබන්නා වු සිජහල අලුත් අවුරුද්ද ඇහැලියගොඩ ආසනයේ සියලුම දෙනාම පමණක් නොව ලංකාවටත්, ගෝලීය වශයෙන් ඇතිවී තිබෙන යුධමය තත්ත්වය සමනය වී ලෝකවාසී ජනතාවටත් යහපත් ජීවන තත්ත්වයක් යළි උදා කර ගැනිමට හැකියාවක් ඇති වේවා කියා ප්‍රාර්ථනා කරන බවත්,ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන්නට විය.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා**

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා විසින් ගෙන එනු ලැබු දම්මුල්ල පොළ විවෘත කිරීම සම්බන්ධ යෝජනාව තමා විසින් එදින ස්ථිර කළ බවත්, ඒ පිළිබඳව තමා සතුටු වන බවත්, තල්දුව වෙළඳ මහතුන්ට ඒ සඳහා අවස්ථාව ලබා දීමට වු හේතුව කුමක්ද යන්න ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා විසින් විමසීමක් කරන ලදී.

**ගරු සභාපති බන්ධුලසේන දූණුවිල මතිතුමා**

දම්මුල්ල පොළ සඳහා ඇහැලියගොඩ හා තල්දුව යන වෙළෙන්දන් දෙපිරිසටම ආරාධනා කල බවත්, ඇහැලියගොඩ වෙළෙඳුන්ට ඒ දිනයට පැමිණිය නොහැකි බව දැන් වු බවත්, ඒ පිළිබඳව ගරු මන්ත්‍රීතුමා ම අදහස් ප්‍රකාශ කිරිම සුදුසු බව දන්වමින් ගරු සභාපති බන්ධුලසේන දූණුවිල මතිතුමා විසින් ගරු වසන්ත සේනාරත්න මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙන ලදී.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා**

තල්දුව වෙඳුන්ට විශේෂිත ආරාධනයක් නොකළ බවත්, ඇහැලියගොඩ වෙළෙඳුන්ට දිනය සම්බන්ධ ප්‍රශ්නයක් පැන නැගුණු බවත්, මුලින්ම වෙළඳාම් කටයුතු පවත්වාගෙන ගිය වෙළෙඳුන්ට මේ සඳහා ආරාධනා කළ බවත්, ඇහැලියගොඩ වෙළඳ සංගමය හා ඉංගිරිය වෙළඳ සංගම් මුලින් වෙළඳාම් කටයුතු කර ගෙන ගොස් තිබු බවත්, ඔවුන් ඒ සම්බන්ධව ප්‍රකාශ කළේ ඒ දවස්වල පවතින තත්ත්වයත් මත වෙළඳ

සංගමයක් සම්බන්ධ කර ගැනීමට අපහසු බව පැවසූ බවත්, වෙළඳ මහතුන් සොයා ගැනී මේ කාර්ය අපටම කර ගැනීමට සිදු වූ බවත්, දන්න දන්න වෙළඳ සංගම් දැනුවත් කළ බවත්, ඒ සඳහා තල්දූව වෙළඳ සංගමයත් සම්බන්ධ වූ බවත්, ඔවුන්ට ප්‍රමාණවත් වෙළඳ ප්‍රජාවක් සිටින බව තල්දූව වෙළඳ සංගමය ප්‍රකාශ කළ බවත්, ඔවුන්ට බ්‍රහස්පතින්දා දිනය ලබා දෙන්න හැකිබව ප්‍රකාශ කළ බවත්, ඇහැලියගොඩ වෙළඳ මහතුන්ට බ්‍රහස්පතින්දා සම්බන්ධ වීමට නොහැකි බව ප්‍රකාශ කළ බවත්, ඒ නිසා ඇහැලියගොඩ වෙළඳ ප්‍රජාව ඉවත් වූ බවත්, තල්දූවට විශේෂ තොරා ගැනීමක් නොකළ බවත්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා විසින් කරුණු පැහැදිලි කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා**

සමාවෙන්න.ඇහැලියගොඩ වෙළඳ සංගමයෙන් එන්න පුළුවන්ද යන්න විමසීමක් කළාද යන්න ප්‍රශ්න කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා**

ඇහැලියගොඩ වෙළඳ සංගමයත් සමඟ වෙළදාම් කටයුතු කරන පුද්ගලයෙක් තම ගම් ප්‍රදේශයේ සිටින බවත්, ඒ පිළිබඳව ඔහුගෙන් විමසීමක් සිදු කළ බවත්, ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.මාලින්ද මුදන්නායක මැතිතුමා**

මෙවර සභාවට යොමු කල යෝජනා ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව තමාගේ බලවත් කණගාටුව ප්‍රකාශ කල බවත්, ලබුගම කලටුවාව අතර අංක 139 ග්‍රාමනිලධාරි වසමට අයත් පවුල් 18 ක් 20 ක් ප්‍රමාණය සඳහා පානීය ජලය ලබා දීමට යෝජනා කරමි යනුවෙන් 3 වෙනි යෝජනාව ලෙස තා ඉදිරිපත් කර තිබූ බවත්, ඔබතුමාගේ මැදිහත් වීමෙන් ජාතික ජලාප්‍රවාහන මණ්ඩලයට ලිපියක් යොමු කර කි.මී 1.5 පමණ බටයක් දාමා ජලය ලබා දීමට හැකි බවත්, ලබුගමයි කලටුවාවයි අතර 20 ක් පමණ ජනතාවක් එහි සිටින බවත්, ඔවුන්ට ජලය නොමැති නොමැති බවත්, එම ජනතාව ජලය ලබා දෙන්න ලෙස ඉල්ලමින් තමා ඒ යෝජනාව යොමු කල බවත්, ලේකම්තුමා එය හිතාමතාම පැහැර හැර ඇති බවත්, ඒපිළිබඳව නැවත කණගාටුව ප්‍රකාශ කරන බවත්, මේ අවස්ථාවේ එය සභා ගත කරන බවත්, ඒ සඳහා මැදිහත් වීමක් වී ඒ පවුල් සඳහා ජලය ලබා දීමට ක්‍රියාමාර්ගයක් කරන ලෙස ඉල්ලීමක් කරන බවත්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.මාලින්ද මුදන්නායක මැතිතුමා ප්‍රකාශ කළේය.

ගියවර සභා වාරයේ සාකච්ඡා වූ ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ කඩ වසා තබන යෝජනාව තමාව මෙන්ෂන් කරලා උපසභාපතිතුමා විසින් සමාජ මාධ්‍යයේ පළ කර තිබූ බවත්, ගරු ගයාෂාන් මන්ත්‍රීතුමා සභාපතිතුමත් සමග සාකච්ඡා කර එම යෝජනාව සබාවට යොමු කළ බවත්, උපසභාපතිතුමා තමාට බඩිය යනුවෙන් සඳහනක් කර තිබූ බවත්, සභාපතිතුමාව හිතා මතා ම අපහසුතාවයට පත් කරන්න එසේ සඳහන් කිරීම පිළිබඳව ද තමා කණගාටුව ප්‍රකාශ කරන බවත්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.මාලින්ද මුදන්නායක මැතිතුමා ප්‍රකාශ කළේය.

සභාවෙන් වීථි පහන් ගෙනා බවත්, එසේ විථි පහන් කොපමණ ප්‍රමාණයක් ගෙනාවද යන්න සභාව දැනුවත් කරන ලෙස තමා ඉල්ලා සිටින බවත්, කුමන ප්‍රදේශ සඳහාද එම විදුලි බල්බ් සවිකර තිබෙන්නේද යන්නත්, මේවන විට කියක් සක්‍රිය තත්ත්වයේ පවතිනවාද යන්නත්, සොයා බැලීමක් කරන ලෙසත්, බල්බ් ගෙනැවිත් මාස 3 ක් 4 ක් පමණ වෙන බවත්, 76 වසරක සාපයක් ගැන කියන බවත්, මාස තුන හතරට බල්බ් පිච්චෙන කොට එය ප්‍රශ්නයක් බවත්, සභාවේ මුදල් මහජනතාවගේ මුදල් බවත්, ඒ පිළිබඳවත් සභාපතිතුමාගේ පූර්ණ අධීක්ෂණයක් සිදු කළ යුතු බවත්, සභාවට ඒ සම්බන්ධව වාර්තාවක් ඉදිරිපත් කිරීමට හැකියාවක් පවතිනවා නම් වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසත්, මාස තුනක් ඇතුළත පිච්චිලා තිබෙනවා නම් බල්බ් , ඒ සඳහා මැදිහත් වූ පුද්ගලයින්ගෙන් ඒ මුදල් අය කර යුතු බවත්, බල්බ්වලට වොරන්ටියක් ලබා දෙන බවත්,ඒ පිළිබඳව සොයා බලා සභාව දැනුවත් කරන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.මාලින්ද මුදන්නායක මැතිතුමා ප්‍රකාශ කළේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා**

පරිසර හා පොදු පහසුකම් කාරක සභාවේ ගරු ආරියදාස මන්ත්‍රීතුමා හා සභාපතිතුමාගේ ලේකම්තුමා බිසෝදොල ඇළ නිරීක්ෂණයට ගිය බවත්, තමාට හදිසි වැඩකටයුත්තක් හේතුවෙන් ඒ සඳහා සහභාගී වීමට නොහැකි වූ බවත්, ඒ සම්බන්ධව වත්තෙ මහත්තයා සමඟ කතා කළ බවත්, එම ජලය වත්තේන නොඑන බවත්, එම ජලය බටුගේන ප්‍රදේශයෙන් එන බවත්, ගෝඩා ප්‍රශ්නයත් මෙතනදී පැන නැගුනත්, ඊටත් වඩා කිරිමැටි ආශ්‍රිත ඉල්ලම් ගැරීම මෙයට හේතුවක් බවත්, ඉල්ලම් ගැරීම් කටයුතු සිදු කරන ස්ථානයට ගමුවැසියන් සමඟ තමා පුද්ගලිකව ගිය බවත්, රාත්‍රියට ඉල්ලම් ගැරිම සිදු කරන බවත්, දැන් එමප්‍රශ්නය නැවති ඇති බවත්, සභාපතිතුමා ඒ පිළිබඳ මැදිහත් වීම පිළිබඳව ස්තූතිය පුදකරන බවත්, මිනිසුන්ට වතුර නැතුව, ජලය කිරි වතුර මිශ්‍ර වී ඇති බව දන්නවා තමාට ගම්වාසින් දුරකතන ඇමතුම් ලබා දෙන බවත්, ගොඩා වලට අමතරව කිරිමැටි ඉල්ලම ගැරු නිසා එසේ වූ බවත්, දැන් ඒ පිළිබඳව පණිවිඩයක් හෝ අදාළ පුද්ගලයාට ලැබී දැන් එම කාර්ය සිදු නොකරන බවත්, පරිසර පොලිසිට තමා දැනුවත් කිරීමක් කළ බවත්, එම ප්‍රශ්නය විසඳීමට සභාපතිතුමාගේ මැදිහත් වීමට ස්තුතිවන්ත වෙන බවත්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා ප්‍රකාශ කරන ලදී.

යෝජනා සම්බන්ධව ලේකම්තුමා ගෙනා යෝජනාවටත් ස්තුතිවන්ත වෙන බවත්,යෝජනා කිරීමට බැරි නම් යෝජනා ඉදිරිපත් කිරීමෙන් එළක් නැති බවත්,තමාත් මේ දක්වා විශාල යෝජනා ප්‍රමාණයක් සභාවට යොමු කළ බවත්, මේ දක්වා එක් යෝජනාවක් පමණක් ක්‍රියාත්මක වූ බවත්, මන්ත්‍රීවරු වශයෙන් යෝජනා ලබා දීමේදී අත්‍යවශ්‍ය යෝජනා පමනක් ගෙන ආ යුතු බවත්, ලැබුවා වූ සිංහල හා දෙමළ අලුත් අවුරුද්ද සෞභාග්‍යමත් නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරන බවත්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමාප්‍රකාශ කරන ලදී.

**ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මතිතුමා**

මෙතැන් සිට සභා කටයුතු ඉදිරියට පවත්වාගෙන යැම සඳහා ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමාට ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මතිතුමා විසින් මුලාසනය භාර දෙන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා**

ලබුගම කලටුවා රක්ෂිත බොඩරයෙන් කොටසක් ඇහැලියගොඩ බල ප්‍රදේශයට අයත් වන බවත්, කාලයක් තිස්සේ එම ප්‍රදේශයේ දැව ජාවාරමක් සිදු වන බවත්, දැනට එහි තිබූ කාර්යාලය ඉවත් කර ඇති බවත්, කි.මී.3 ක පමණ ප්‍රමාණයක දැව ජාවාරම සිදුවන බවත්, බලධාරීන් දැනුවත් කළත් කිසිම බලධාරියෙකුගෙන් සාධනීය පිළිතුරක් නොලැබුණ බවත්, රාජ්‍ය නිලධාරීන් කිසිම කෙනෙක් මේකට සම්බන්ධවෙන් නැති බවත්, මෙය මහාපාරිමාණ ජාවාරමක් බවත්, පුවක්පිටිය හන්දි තුනටම ඔත්තු බැලීම සඳහා ඔවුන් විසින් මිනිසුන් දමා ඇති බවත්, මේ සම්බන්ධව දැනුවත් කිරීම සඳහා පරිසර ඇමතිතුමාට කතා කළ බවත්, අක්කර 7000 න් 3500 ක පමණ වපසරියත් තම කොට්ඨාශයට අයත් බවත්, මේ සම්බන්ධව සම්බන්ධිකරණ රැස්වීමේදිද දැනුවත් කිරීමක් කළ බවත්, එදින එක වාහනයක් අත්අඩංගුවට ගත් බවත්, මේ සඳහා සභාවක් විදිහට මැදිහත් වීමක් කිරීමට හැකියාවක් පවතින්නේ නම් ඒ සඳහා අවශ්‍ය කටයුතු කරන ලෙසත්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.එල්.රුවන්සිරි විමලරත්න මැතිතුමා**

පහුගිය නියන්කාල සමයේ මාපොට කොස්හේන ප්‍රදේශයේ යෝජනා කර තිබූ ජල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කර ගැනීමට නොහැකි වූ බවත්, ඒ නිසා ජලය නොමැතිව ඒ ප්‍රදේශවාසීන් දැඩි පිඩාවට පත් වූ බවත්, ඒ අවස්ථාවේ සභාපතිතුමා දැනුවත් කළ විට ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මතිතුමා අවශ්‍ය ජල ප්‍රමාණයන් ඒ ප්‍රදේහයට සැපයූ බවත්,ඒ ප්‍රදේශයේ මන්ත්‍රීවැයා විදිහට තමන් ස්තුති කරන බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.එල්.රුවන්සිරි විමලරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ආසන්න වසමේ මන්ත්‍රීවරයා වශයෙන් තමන් දම්මුල්ල පොල සම්බන්ධව අදහසක් දැක්විය යුතු බවත්, දම්මුල්ල පොලේ තව කඩ කාරමර කීපය ඉතිරි වී තිබෙන බවත්, ඇහැලියගොඩ වෙළඳ සංගමයටත් නැවත වරක් ආරාධනාවක් කිරිමට හැකියාවක් තිබෙන බවත්, එතුමා වැඩිදුරටත් ප්‍රකාශ කරන්නට විය.

**ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා**

2026 මාර්තු මස 26 දින දඹුල්ල පොල ආරම්භ කිරීම සම්බන්ධව දැන්වීම් මඟින් දැනුවත් කිරීම් සිදු කළ බවත්, ඇහැලියගොඩ පොළ භූමියෙත් එම දැන්වීම් ප්‍රදර්ශනය කළ බවත්, ඇහැලියගොඩ වෙළඳ සංගමයට ඉදිරියට ඉදිපත් වනු ඇතැයි ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය**

සභාවට යොමු කළ යෝජනා 3 න ම ප්‍රතික්ෂේප වී ඇති බවත්, බල්ලන්ට එන්නත් කර කරපටිය ලබා දීම සම්බන්ධව යෝජනාවක් දැමූ බවත්, බල්ලන්ට එන්නත් කිරීම සම්බන්ධ වැඩසටහන පිළිබඳ රැස්වීමක් තිබූ බවත්, එහිදී ඇතිවන අපහසුතා පිළිබඳ සාකච්ඡා වූ බවත්, එන්නත් වැඩසටහන් සිදුවන ස්ථානවලට ගොස් තමන්ට කරන්න පුළුවන් දේ කළ බවත්, ඒ වෙලේ දැකපු ප්‍රකාශ කළ බවත්, අයවැයෙන් වෙන් වූ දෙයක් බවත්, විශාල වැඩ සටහනක් බවත්, වසම්වල ක්‍රියාත්මක නොවීම පිළිබඳව සාකච්ඡා කළ බවත්, එය ගියවර සභා වාර්තාවේ සඳහන් වී නොතිබූ බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.

විජේනායක මාවතේ මල්ලිකා මහත්මියගේ නිවසයි සමෘර්ධි කාර්යාලයයි කියන්නේ එකම නිවස බවත්, අවුරුදු 20 කට ඉහත දී සමෘර්ධි කාර්යාලයක් තිබූ නමුත් මේවනවිට කාර්යාලයක් එම නිවසේ නොමැති බවත්, එකල සිට වරිපනම් ඉවත් කර ගැනීමට ඉල්ලීම් කළ බවත්, වසර දෙකකට ඉහතදී තමාගේ අත් අකුරින් ම ලිපියක් ලියා සභාවට යොමු කල බවත්, තවම ඒ සඳහා විසඳුමක් ලැබී නොමැති බවත්, මෙවර වරිපනම් මුදල වැඩි වීමත් සමඟ ඒ මිනිසුන් අපහසුතාවයට පත් වී ඇති බවත්, ඒ නිසා යෝජනාවක් වදිහට සභාවට යොමු කළ බවත්, අවුරුදු 20 ක කාලයක සිට කාර්යාලයක් නොමැතිව, කාර්යාලයටත් වරිපනම් ලබා ගෙන ඇති බවත්, සමෘර්ධි සංවර්ධන නිලධාරීන්ට කාර්යාල දීමනාවක්වත් නොලබුණු කාලෙක සිට වරිපනම් බදු එකතු කර ඇති බවත්, ඒ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කොට කාර්යාලය සඳහා අය කරන වරිපනම් මුදල නිදහස් කිරීමට කටයුතු කර දෙන ලෙස ඉල්ලා සිටින බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.

හොරගොඩ බෝපැත්ත පාරේ ඕවිට ප්‍රදේශයේ කාණු පද්ධතිය සුද්ද කිරීම යන යෝජනාව, උඩුමත්ත වසම කෙළවර බවත්, අඩි 4 ක පමණ කාණුව අවසානයට යන විට අඩියක් විතර දක්වා අඩු වී ඇති බවත්, අලුතින් පදිංචි පිරිසක් මේ වන විට පදිංචි වී සිටින බවත්, අලුත් පදිංචි නිවසියන්ගේ නිවසට යැමට කාණුව හරස් කොට කොන්ක්‍රිට් ලැල්ල දමා ඇති බවත්, එම ස්ථානයේ ජලය එකතු වූ විට සතියක් දෙකක් යන තෙක් ජලය රැදී පවතින බවත්, මදුරුවන් පවා බෝවන බවත්, මෙය ගම්වැසියන්ගෙන් ආ ප්‍රශ්නයක් බවත්, නිවසියන් දැනුවත් කර ඒ කාණුව සුද්ද කළහොත් ජලය බැස යන බවත්, ඒ පිළිබඳව කාර්මික සේවා කාරක සභාවට යොමු කිරීමට කටයුතු කරන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.

ඇහැලියගොඩ පොළේ බඩු මිළ වැඩි බවත්, ඒ සම්බන්ධව සාකච්ඡා කිරීමට පෙර පැවති සභාවක අවධානය යොමු කළ බවත්, එහි මේ වන විට ප්‍රගතියක් තිබේද යන්න දැන ගැනීමට කැමති බවත්, ප්‍රකාශ කළා.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ටත් ඉන්ධන දීමනාවක් ලබා දී ඇති බවත්, සභාපතිතුමා ඉන්දන දීමනාව කොයි ආකාරයෙන් ලැබෙන්නේද යන්න , ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය විසින් විමසන ලදී.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලින් කරුණාපාල මැතිතුමා**

අතිගරු ජනාධිපතිතුමා අලුතින් හඳුන්වා දුන්නා QR ගෙවීමේ පද්ධතියක් හඳුන්වා දෙනු ලැබූ බවත්, ඒ සඳහා ප්‍රථමයෙන් ස්තුතිවන්ත වෙන බවත්, මේ වගේ වෙලාවේදී ඒ QR පද්ධතිය ඉතා වැදගත් බවත්, දූෂණ අක්‍රමිකතා වලක්වා ගැනීම සඳහා එම පද්ධතිය වැදගත් බවත්, ඒ සඳහා ජනතාව විදිහටත් ස්තුතිවන්න විය යුතු බවත්, පහුගිය ආණ්ඩුව කාලෙත් මේ සඳහා මූලික සූදානමක් තිබූ බවත්, යම් අඩු නිසා ප්‍රමාද වුබවත්, මේ රජයෙන් ඒ ගත්ත උත්සහයට ස්තුතිවන්ත වන බවත්, මෙය ජනතාව අතරට කොහොමද ගෙනියන්නේ කියන කාරණාව සම්බන්ධව සබාවක් විදිහට මහජන නියෝජිතයින් විදිහට වගකීමක් පැවරී ඇති බවත්, ඒ සඳහා ඉක්මනින් ක්‍රියාමාර්ග ගත යුතු බවත්, වෙළඳසැල්වලට පාරිභෝගිකයින් අතරට ගොස් හොඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් සභාව හරහා ක්‍රියාත්මක කළ යුතු බවත්, තමා පෞද්ගලිකව විශේෂ අධ්‍යනයක් කළ බවත්, අනාගතයේදී ව්‍යවහාර නෝට්ටු භාවිතයෙන් නැති වී යන බවත්, ඒ වෙනුවට මේ ඩිජිටල් මුදල් ක්‍රමය

පැමිණෙන බවත්, ඒ හරහා පිරිසිදු ආකාරයට බදු මුදල් අය කර ගැනීම පවා සිදු කල හැකි බවත්, මේක ඉතා වැදගත් කාරණාවක් බවත්, ඒ වෙනුවෙන් ගන්නා වු සෑම ක්‍රියාවකටම තමා පෞද්ගලිකව උදව් කිරීමට කැමති බවත්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කළේය.

ජනාධිපතිතුමා ජනතාවට සහන පැකේජයක් ලබා දීමට අද දහවල් පාර්ලිමේන්තුවට පැමිණීමට නියමිත බවත්, මේ මාස 16 තුළ ලබා දුන් සහන පැකේජ් ගැන දැනුවත් බවත්, ඒ පිළිබඳව හොඳ අවබොධයක් ජනතාවට තිබෙන බවත්, ජනතාව මේ සම්බන්ධව කතා කරන බවත්, ගෑස් එක ගන්න විදිහක් නැතුව ජනතාව ඉතාමත් ම අසීරුතාවට පත් වී ඇති බවත්, සභාවට යොමු කරන යෝජනා ප්‍රතික්ෂේප කලත්, සභාවට පැමිණ කතා කරන්නේ මහජනතාවගේ ප්‍රශ්න බවත්, ගෑස් නොමැති නම් ඇහැලියගොඩට ප්‍රාදේශිය සභාවට ඒ සම්බන්ධව ක්‍රියාත්මක වෙන්න බලයක් නොමැති නම් ගෑස් බෙදන්න කියනව නම් ඒක වැරදි බවත්, ඒ ආදාළ ආයතන සමඟ සම්බන්ධිකරණය කර ගෑස් නැත්නම් ජනතාවට ගෑස් ලබා දෙන්න.තමන් පෞද්ගලිකවත් සභාපතිතුමා සමඟ මේ සම්බන්ධව කතා කල බවත්, යම් වැඩපිළිවෙලකයට ඒ සඳහා මැදිහත් විය යුතු බවත්, නාගරික පරිසරයෙන් ඈත්ව ජීවත් වෙන අයට දර කැල්ලක් හෝ සපයා ගත හැකි බවත්, නමුත් නාගරික ජීවත් වන ජනතාවට ඒ හැකියාව නොමැති බවත්, තෙල් ප්‍රශ්නයට වඩා ගෑස් ප්‍රශ්නය විශාල වශයෙන් බලපාන බවත්, ඒ නිසා ආණ්ඩුවක් විදිහට උපරිම කාර්යක්ෂමතාවයෙන් යුතුව මේ ගෑස් ප්‍රශ්නයට මැදිහත් විය යුතු බවත්, නැත්නම් පසුගිය ආණ්ඩුවට වුණු වැඩේම මේ ආණ්ඩුවටත් ඉක්මනටම සිද්ධ වෙන බවත්,ගෑස් කියන එක ප්‍රබල සාධකයක් බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කළේය.

QR ක්‍රමයකට ගොස් ඉන්ධන කෝටාව නැවත ලබා දෙමු කියන යෝජනාව තමා මාර්තු මස සභා වාරයේදී යෝජනා කල බවත්, ඔබතුමන්ලා හරහා ඔබතුමන්ලගේ නායකයන්ට ඒ පණිවිඩය ලැබෙයි කියන විස්වාසයෙන් එදා ඒ යෝජනාව කළ බවත්, නමුත් එහෙම අවශ්‍යතාවයක් නැති බවත්, ඇති තරම් ඉන්ධන තිබෙන බවත්, සලාක ක්‍රමයකට යෑමට අවශ්‍යතාවයක් නොමැති බවත්, ඒ අවස්ථාවේ ගරු සභාපති බන්ඩුලසේන දුණුවිල මතිතුමා විසින් ප්‍රකාශ කළ බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කළේය. සභාවේදී ප්‍රකාශ කරන කාරණා එක හෙලා ඉවත් නොකර, එයින් යම් දෙයක් ගත හැකි නම් ලබා ගන්නා ලෙසත්, පසුගිය සභා කාලේ තමන් ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා සමඟ වැඩ කළ බවත්, ඒ කාලය තුළ සභාව තුළින් එකතු කර ගත්තා වු දැනුමක් තමන්ට තිබෙන බවත්, සභාව වෙනුවන්, ඇහැලියගොඩ ජීවත් වෙන ජනතාව වෙනුවෙන් තමන්ගෙනුත් ගත හැකි යම් දෙයක් වේද එය ලබා ගන්නා ලෙසත්, ඒ සඳහා වැඩපිළිවෙළක් ඔබතුමන්ලා හැදිය යුතු බවත්, ඒ වැඩපිළිවෙළ නැති කරන්න හොඳ නැති බවත්, කලින් සභාවලදී කතා කරපු කාරණා ම අද උදේ සිට සභාවේ කතා කළ බවත්,එක් අවස්ථාවක හිදුරංගල ගරු ජයසේකර මන්ත්‍රිතුමා අපහසුතාවයකට පත් වු බවත්, ඒ අවස්ථාවේ එතුමගේ යෝජනාව පරාජයට පත් කරන්න උවමනාවක් නොතිබුණු බවත්, ඒය හිදුරංගල ග්‍රාමීය රෝහලට පුටු ලබා දිම සම්බන්ධ යෝජනාවක් බවත්, එය සභා විෂය පථයේ නොමැති යෝජනාවක් වුවත් ඒ යෝජනාව න්‍යාය පත්‍රයේ තිබු නමුත් විෂයේ පථයේ නොමැති විපක්ෂයෙන් ඉදිරිපත් කල යෝජනා විෂය පථයෙන් ඉවත් කර තිබු බවත්, එදා වු කාරණාව නැවත නැවත ප්‍රකාශ කළ යුතු නොමැති බවත්, එක් මන්ත්‍රිවරයෙකුට යොජනා 3 ක් ඇතුලත් කිරීමට අවස්ථාව තිබු බවත්, ඉදිරිපත් කරන සෑම යෝජනාවක් ම න්‍යාය පත්‍රයට ඇතුළත් කරන බවට එදින එකතාවයකට පැමිණි බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කළේය.යෝජනාවල වැදගත්කම අනුව යෝජනා ඇතුළත් කළ යුතු බව ගරු සමන්සිරි මන්ත්‍රිතුමා මේ මොහෙතේ ප්‍රකාශ කළ බවත්, වැදගත්කම පුද්ගලයාගෙන් පුද්ගලයාගෙන් පුද්ගලයාට ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් වෙන බවත්, එය සාපේක්ෂ කාරණාවක් බවත්, මෙහිදී ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් අවධාරණය කළේය. එම සාපේක්ෂතාවය තෙරුම් ගෙන න්‍යාය පත්‍රයට යෝජනා ඇතුලත් කිරීමට කටයුතු කරන ලෙසත්, යෝජනාවල වැදගත්කම මනින්නේ සබාවේ කතා කරන දේවල්වලින්ද ? නැතිනම් ජනතාවගේ සිතුම් පැතුම්වලින් ද? යන්න විසීමක් කරන ලදී.මුල්කාලයේ ප්‍රාදේශිය සම්බන්ධීකරණ රැස්වීමට සභාවේ සියලුම මන්ත්‍රිවරුන්ට සහභාගී විමට අවස්ථාව තිබු නමුත් වත්මන් ආණ්ඩුව තල එම අවස්ථාව අහිමි කරමින් ඒ සඳහා විපක්ෂ මන්ත්‍රිවරු දෙදෙනෙකුට පමණක් සහභාගී විමට අවස්ථාව සිමා වී ඇති බවත්, පමනක්ජනතාවගේ ප්‍රශ්න කතා කිරීමට ඇති එකම ස්ථානය සභා රැස්වීම පමනක් බවත්, එම නිසා සභා න්‍යාය පත්‍රයට ඇතළත් කිරීමට ලබා දෙන සියලු යෝජනා න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට කටයුතු කරන ලෙසත්, පසුගියට සම්බන්ධීකරණ රැස්විමට පක්ෂයේ මන්ත්‍රිවරු 9 දෙනෙකු පමණ සහභාගී තිබු බවත්, එසේ පැමිණීමට ඇති ක්‍රමවෙදය තමා සොයා බැලු බවත්, එම මන්ත්‍රිවර්න්ගේ යෝජනා තිබු නිසා එදින රැස්වීමට සහභාගී වී සිටි බව දැන ගැනීමට හැකි වු බවත්, නිලධාරින් හා දේශපාලනය ගැටෙන අවස්ථා තියෙන බවත් එස් විය යුතු නැති බවත්, සම්බන්ධීකරණ රැස්විම දේශපානය හා නිලධාරින් හමුවෙන්න තිබෙන අවස්ථාවක්

බවත්, ඒ දේශපාලන බලය, මහජනතාවගේ බලය, ප්‍රජාතන්ත්‍රවාදී බලය මන්ත්‍රිවරු වෙත පවරා තිබෙන්නේ නිලධාරින්ගෙන් කුමක් හෝ අඩුපාඩුවක් තිබෙනවා නම් ඒ ගැන කතා කරන්න බවත්, ඒ අවස්ථාව අහිමි කරන්න එපා යන්නත්,ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කළේය.
මේවනවිට මහජනතාව පුන පුනා බලා සිටින්නේ ජනාධිපතිතුමා විසින් අද දින පාර්ලිමේන්තුව අමතමින් ජනතාවට ලබා දෙන සහන පැකේජය කුමක්ද යන්න බවත්, මිනිසුන්ට මේවනවිට ගෑස් නොමැති බවත්, මේවන විට තෙල් ප්‍රශනය අඩු වී ඇති බවත්, ආණ්ඩුව ප්‍රකාශ කල ආකාරයට මෙච්චර ප්‍රශ්නයකට මුහුන දෙන්න සිදු වේ යැයි නොසිතු බවත්, එක්තරා අවස්ථාවක ඇමතිවරයෙක් සිංගප්පූරුවෙන්, ඉන්දියාවෙන් තෙල් ගේන බවත්, හෝමු සමුද්‍ර සන්දිය වැසුවට ප්‍රශ්නයක් නොමැති බව ප්‍රකාශ කල බවත්, යුද්දයේ බලපෑම විපක්ෂයක් විදිහට අවබෝධ කර ගත්තට ආණ්ඩුව අවබෝධ කරගෙන නොමැති බවත්, මෙවැනි දේවල අත්දැකිම විපක්සයට තිබෙන බවත්, සර්වපාක්ෂික කමිටුවක් පසුව ජනාධිපතිතුමා විසින් කැඳවා තිබු බවත්, එසේ පක්ෂ විපක්ෂ භේදයකින් තොරව මේ අර්බුදයට මුහුණ දිය යුතු බවත්, අර්බුදය තුළින් ජයගෙන විපක්ෂය ඊළඟ ආණ්ඩු බලය ගන්න බලන් නැති බවත්, 76 වසරක සාපය අවසන් කර හොඳම ජනතාවක් ජීවත් වෙන රටක 2029 වර්ෂයේ මැතිවරණය තිබෙන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කළේය.

ලේකම්තුමත් හොද පළපුරුද්දක් තිබෙන ලේකම්වරයෙක් බවත්, එතුමන් අතිතයේ ගත්ත භාවිතයන් පිළිබඳව විපක්ෂයක් හැටියට සොයා බැලු බවත්, එතුමන් ගේ පලපුරුද්ද ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවට වැදගත් බවත්, යෝජනා ප්‍රතික්ෂේප වු කාරණාව සම්බන්ධව ගරු රණවිර මන්ත්‍රීතුමා වෙනත් අදහසක සිටි බවත්, නමුත් ජනතාවගේ ප්‍රශ්න යෝජනා කලින් සාකච්ඡා කළ ආකාරයට න්‍යාය පත්‍රයට ඇතුළත් කරිමට අවස්ථාව ලබා දෙන ලෙසත්, මන්ත්‍රිවරු බඩගින්නේ ඉදිමින් හරි ජනතාවගේ ප්‍රශ්න ජනතාව වෙනුවෙන් කතා කළ යුතු බවත්, අද සභාව සඳහා සුදානම හොඳ බවත්, ජනතාවගේ ප්‍රශ්න කතා කිරීමට අවස්ථාවක් සකසා දෙන මෙන් ඉල්ලමින් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් අදහස් ප්‍රකාශ කළේය.

**ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා**

යෝජනා සම්බන්ධව ඒකාබද්ධ කාරක සභාවක් රැස් කර අවසන් තීරනයක් ගත යුතු බවත්, මෙවර න්‍යාය පත්‍රයේ යෝජනා ප්‍රතිෂේප විම පක්ෂ විපක්ෂ භේදයකින් තොරව දෙපැත්තෙන් ම සිදු වු බවත්, මුදල් කමිටුයේදි මේ යෝජනා ප්‍රතික්ෂේප කිරිම සම්බන්ධව කතා වු බවත්, මේ වන විට සංවර්ධන යෝජනා තතුන්සිය හැත්තෑ ගණනක් සම්මත වී ඇති බවත්, මෙය ක්‍රමවත් වැඩපිළිවෙක් හරහා සිදු කල යුතු බවත්, කොට්ඨාශ මට්ටමින් හෝ බල ප්‍රදේශවලින් හෝ මන්ත්‍රිවරු මට්ටමින් හෝ කුමක් හෝ නිර්ණායක මත පදනම් වී වසම් 44 ම ප්‍රතිපාදන වෙන් ඕන බවත්, ඒ නිසා ඒකාබද්ධ කාරක සභාවේදී ඒ සම්බන්ධව පොදු තීරණයක්ට එළඹිම සුදුසු ලෙස ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කළේය.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා**

2026.03.22 ලිපියක් ලැබී ඇති බවත්, "2026.01.13 වන දින පැවැත්වීමට නියමිත සාමාන්‍ය මහා රැස්වීමේ න්‍යාපත්‍රයට ඇතුළත් කිරීම සඳහා ඔබතුමා විසින් ඉදිරිපත් කල යෝජනාව පහත සඳහන් හේතුන් මත 2026.04.07 වන දින න්‍යාය පත්‍රයට ඇතුලත් නොකරන බව කාරුණිකව දන්වමි" ලෙස සඳහන් ඇති බවත්, මේ ලිපිය මොකක්ද යන්නත්, අකුරු ලියන්න පුළුවන් අය මේ ලිපිය සකසා ඇතිබව තමන් සිතන බවත්, අත්සන් කරන්න ඇත්තෙත් අකුරු ලියන්න පුළුවන් අය කියා සිතන බවත්, මේක ගැටලු සහගත තත්ත්වයක් බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කළේය.

මේවනවිට රටේ ආර්ථික අර්බුදයක් පවතින බවත්, ජීවන වියදම ඉහළ ගොස් ඇති බවත්, පෙට්‍රල්, ඩීසල් මිළ ඉහල ගොස් තිබෙන බවත්, ඊයේ දින ගෑස් රුපියල් හත්සිය ගණනකින් වැඩි වු බවත්, මේ තත්ත්වයත් එක්ක දැන් ජනාධිපතිතුමා සහන පැකේජයක් ලබා දීමට සැරසෙන බවත්, නමුත් මේ ප්‍රදේශයේ ජීවත්වෙන ජනතාවට සහනයක් ලබාදෙන ලෙස ඉල්ලමින් සබාවට යෝජනාවක් ඉදිරිපත් කල විට ඒ යෝජනා ප්‍රතික්සේප කරන බවත්, ජනාධිපතිවරයා අද දින පාර්ලිමේන්තුවට පැමිණ ප්‍රකාශයක් කර සහන ලබා දෙන්න ප්‍රකාශ කල බවත්, ජනතාවට අමාරු වෙලාවට ජනතාවට සහන දිය යුතු බවත්, ආර්ථික වශයෙන් යම් ගැටලුවක් ඇති වී තිබේ නම් ඒ සඳහා සහන දිය යුතු බවත්, සභාවක් විදිහට යෝජනාවක් ඉදිරිපත් කළ විට ඒ යෝජනා ප්‍රතික්ෂේප කිරීමට කටයුතු කර ඇති බවත්, ඒසේ ප්‍රතික්ෂේප කර ඇත්තේ 2025.09.09 වන දින යෝජනා අංක 6.56 යටතේ ඒකමතිකව සම්මත කළ නිසා බවත්, නමුත් ඒ වෙන කොට තිබු ආර්ථික

තත්ත්වයක් අද නොමැති බවත්, සියලුම දේ මේ වනවිට වැඩි වී ඇති බවත්, ආණ්ඩුව ආවේ විදුලි බිල මාස තුනෙන් තුනෙන් එකක් අඩු කරනවා කියා බවත්, මාස 6 ක් යන කොට සිය ගුණයකින් වැඩි වී ඇති බවත්, මේවා සම්බන්ධව කතා කරන්න යෝජනාවක් සභාවට දාන්නත් බැරි නම් ඉහි තේරුම මොකක් ද යන්න ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා විසින් විමසන ලදී.

මුදල් කමිටුවේ දී ගත් තීන්දුවෙන් පිට ගොස් යෝජනා ප්‍රතික්ෂේප කර ඇති බවත්, යෝජනා සියල්ල ම න්‍යාය පත්‍රයට ඇතළත් කරන ලෙසට සභාපතිතුමා උපදෙස් දුන් බව සභාපතිතුමා ප්‍රකාශ කල බවත්, ඒසේ නම් ඇහැලියගොඩ ප්‍රාදේශීය සබාවේ සබාපතිවරයා කවුද?ගරු සභාපති බන්ධුලසේන දූණුවිල මතිතුමා ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපති ලෙස කටයුතු කරන කොට පැලවත්තෙන් පැමිණ මෙම සබාව පාලනය කරනවාද යන්න ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා විසින් ප්‍රශ්න කරන ලදී. සබාවේ පැලවත්තෙ සභාපතිවරයෙක් සිටින බව හැමතැනම කතා වෙන බවත්, මේ සබාව සබාපතිවරයාට කරගෙන යැමට ඉඩ දෙන ලෙසත්, සබාපතිතුමාට උදව් කිරිමට පලාත් පාලන කේෂත්‍රයේ අත්දැකිම් තියෙන ලේකම්තුමා ඉන්න බවත්, එතුමා සබාවට පැමිණි අවස්ථාවේ කිසිම ප්‍රගතියක් නැති, කාරක සභාවක් නිවරදිව ක්‍රියාත්මක නොවන සභාවක් විදිහට ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව දකින්න ඇති බවත්, ඒ සභාව යම්කිසි මට්ටමකට නිවරදි කිරීමට ලේකම්තුමා උත්සහක යෙදෙන බවට තමාට දැන ගැනිමට ලැබුණු බවත්, ඒ සඳහා තමා සුභ පතන බවත් ප්‍රකාශ කලේය. ජනතාව වෙනුවෙන් ගේන යෝජනා සභා නයාය පත්‍රයෙන් ඉවත් කරන්න ලේකම්තුමා උත්සහ ගන්නව නම්, නොයෙසේ නම් නෙත් කන්ඩායමකට බලය පවරා ඒ කන්ඩායමට අවශ්‍ය යෝජනා පමණක් සභාවට ඉදිරිපත් කරන්න කටයුතු කරනවා නම්, එය වැරදි අඥාත තින්දුවක් ලෙස තමා දකින බවත්, අනිත් යෝජනා ප්‍රතික්ෂේප වන විට ගරු එච්.එල්. ජයසේකර මැන්ත්‍රිතුමා යොමු කළ යෝජනාව ඇතුලත් කර ඇති බවත්, ගරු අයි.එච්. රණවීර මන්ත්‍රිතුමා ඉදිරිපත් කළ වැටක් ඉදි කිරීම සම්බන්ධ යෝජනාව, ගරු සමන්සිරි මන්ත්‍රිතුමා ඉදිරිපත් කළ ළිදක් සම්බන්ධ යෝජනාව, ඇති බවත්, පක්ෂයේ මන්ත්‍රිවරුන්ගේ යෝජනා පමනක් ඇතුළත් කර ඇති බවත්, මෙවැනි අසාධාරණ කටයුතු නොකළ යුතු බවත්, තමන් පදිජචි කොට්ඨාශය වන යකුදාගොඩ කොට්ඨාශයේ එක යෝජනාවක්වත් නොමැති බවත්, සමහර මන්ත්‍රිවරුන්ගේ යෝජනාවලට පනක් අවස්ථාව ලබා දෙන ආකාරයක් මේ තුළින් පෙනී යන බවත්, කොට්ඨාශයේ මන්ත්‍රිවරයාට ලබා දෙන බලය, විපක්ෂයෙත් කොට්ඨාශය ජයග්‍රහනය කල මන්ත්‍රිවරයාට හිමි විය යුතු බවත්, ඇහැලියගොඩින් විපක්ෂයෙන් ජයග්‍රහනය කළ මන්ත්‍රිවරයා ගරු දිලින් කරුණාපාල මන්ත්‍රිවරයා බවත්, එතුමාට ඒ වරප්‍රසාද නැති බවත්, ප්‍රජා සංවර්ධන කමිටුවටත් එතුමාට අවස්ථාව නැති බවත්, එතුම ගේන සංවර්ධන යෝජනා ක්‍රියාත්මක නොවන බවත්, එම නිසා මේ සම්බන්ධව ක්‍රියාමාර්ගයක් ගත යුතු බවත්, සභාපතිවරයා යෝජනා න්‍යාය පත්‍රයට ඇතුළත් කිරිමට කයුතු කරන ලෙස උපදෙස් ලබා දි තිබියදිත් එබතුමාලගේ වෙනත් කන්ඩායමක් මඟින් යෝජනා කපා හරින බවත්, ඒ අසාධාරණය සභාවේ මන්ත්‍රිවුන්ට සිදු වී ඇති බවත්, ගරු ජයසේකර මන්ත්‍රිතුමාගේ යෝජනාව පමණක් ඇතුළත් කර ඇති බවත්, ඒකට හේතුව කුමක්ද යන්න තමා නොදන්නා බවත්, මේ යෝජනා කපා හරින්නේ කවුද යන්නත්, සභාවේ තින්දු තිරණ ගන්න බලධාරියා කවුද යන්නත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා ප්‍රශ්න කරන ලදී.

ගරු මාලින්ද මුදන්නායක මන්ත්‍රිතුමාට බඩියා යනුවෙන් සඳහන් comment එකක් සමාජ මාධ්‍ය හරහා යොමු කර තිබු බවත්, බඩියා කවුද කියන එක ඔබතුමාලා දන්නා බවත්, තමා ඒ යෝජනාව සභා යෝජනාවක් ලෙස ඉදිරිපත් කලේ ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ නිත්‍යානුකූල සභාපතිවරයා සමඟ සාකච්ඡා කර බවත්, නිත්‍යානුකූල සබාපතිවරයාට පිටින් සබාව මෙහෙයවන පුද්ගලයින් සමඟ සාකච්චා කර නොවන බවත්, එම නිසා facebook වල පළ කරමින් ගැටලු ඇතිකර ගැනිමට නොයන ලෙසත්, වැඩපිළිවෙලක් කරන විට හැමවෙලේ ම එක ආකාරයෙන් කරන ලෙසත්, එවිට එක විදියට ගමනක් යන්න හැකි බවත්, ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමාට සබාපති පුටුවට යැමට අවස්ථාව ලැබෙන ලෙසට ප්‍රාර්ථනා කරන බව පවසමින්, සියලුම දෙනාට ලබන්නා වු සිංහල දෙළම අලුත් අවුරුද්ද සුභ අලුත් අවුරුද්දක් වේවා ලෙස ප්‍රාර්ථනා කරමින්,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා විසින් අදහස් ප්‍රකාශ කළේ ය.

**ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා**

සංවර්ධනා යෝජනා හා තවත් යෝජනා ගණනාවක් මේවර සභා න්‍යාය පත්‍රයට ඇතුළත් නොකළ බවත්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කළ වරිපනම් බදු 50% කින් කපා හරින ලෙසට යෝජනාව ඉදිරිපත් කර තිබු බවත්, ඒ සඳහා අදාළ පැහැදිලි කිරීමට එතුමාට ලබා දී ඇති බවත්, එතුමාට ඒ සඳහා ක්‍රියාත්මක වීමට තිබු අවස්ථාව හා මීළඟට එය සිදු කරනවා නම් එය සිදු කරන්නේ කොයි ආකාරයෙන්ද යන්න එතුමාට පැහැදිලි කර ලිපියක් මඟින් යොමු කර ඇති බවත්,

මේවන විටත් අලුත් මිල තක්සේරුව යටතේ 50% ක පමණ ප්‍රමාණයක් එකතු වී ඇති බවත්, වරිපනම් ගෙවීමට අපහසු ජනතාව ගොණු කළ විරෝධතා සඳහා මේවන විට පරික්ෂණ සිදු වන බවත්, එසේ ක්‍රියාවලියක් යන අතර නැවත වරිපනම් අඩු කිරීමක් සිදු කල නොහැකි බවත්, ඒ තක්සේරු මුදල්වලට අදාළව අයවැය සම්මත වී ඇති බවත්, මේවනවිට වරිපනම් ගෙවූ පුද්ගලයින් සිටින බවත්, එම නිසා ලබන වර්ෂයට අදාළව වරිපනම් සංශෝධනයට යායුතු නම් ඒ සඳහා එතුමාට යොමු විය හැකි බවත්, රටේ දැන් ඇති වී තිබෙන අර්බුදය රටේ අභයන්තරයේ ඇති වී තිබෙන ප්‍රශ්නයක් නිසා නොවන බවත්, ජාත්‍යන්තර දේශපාලනය තුළ ඇති වී ඇති ප්‍රශ්නයක් බවත්, ඒ තත්ත්වය තුළ මේ ආණ්ඩුවේ මැදිහත් වීමෙන් උපරිම සහන ලබා දී ඇති බවත්, මේ මොහොතේ දී ජනාධිපතිතුමා පාර්ලිමේන්තුව ආමන්ත්‍රණය කරන බවත්, සහන දීමට අවශ්‍ය පුද්ගලයින්ට සහන දෙන බවත්, ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කළේය.

සංවර්ධන යෝජනා න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සඳහා ඒකාබද්ධ කාරක සභාවක් හරහා තීරණය කර සිදු කරන බව පැවසුවද එය සිදු කර ගැනීමට නොහැකි වූ බවද, මීළඟ සභාවාරයේ න්‍යාය පත්‍රය සැකස් කිරීමට පෙර ඒකාබද්ධ කාරක සභාවක් පැවැත්වීමට කටයුතු කරන බවත්, ඒ සඳහා සියලුම මන්ත්‍රීවරුන්ට පැමිණෙන ලෙස ආරාධනා කරන බවත්, මෙම සභාවේ ආධුනික මන්ත්‍රීවරු බොහොමයක් සිටින බවත්, සභාවට ප්‍රතිපාදන ලාබෙන ආකාර කිහිපයක් තිබෙන බවත්, ප්‍රාදේශීය සභාවෙන් සිදු කරන්නේ ප්‍රාදේශීය සභා ප්‍රතිපාද වෙන් කිරීම පමනක් නොවන බවත්, ප්‍රදේශයේ සංවර්ධනය වෙනුවෙන් අමාත්‍යාංශය මඟින්, පළාත් සභාව මඟින්, විවිධ අරමුදල් හරහා ප්‍රතිපාදන ලැබෙන බවත්, ප්‍රාදේශීය සභා ප්‍රතිපාදන තුලින් සියලුම සංවර්ධන ව්‍යාපෘති සිදු කල නොහැකි බවත්, ඒ ඒ කාර්යන් සඳහා ඒඒ ආයතන හරහා ප්‍රතිපාදන ලබා ගත යුතු බවත්, සංවර්ධන ව්‍යාපෘති සඳහා මේ වර්ෂය තුළ වියදම් දැරිය හැකි සීමාව මෙවර අයවැය තුළ සඳහන් කර ඇති බවත්, ඒ අනුව සැලැස්මක් සකස් කර ගත යුතු බවත්, ඒ සම්බන්ධව ඒකාබද්ධ කාරක සභාව මඟින් සිදු කර ගැනීමට කටයුතු කළ යුතු බවත් ඒ දිනයක් පසුව දැනුවත් කරන බවත්, ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කළේය.(ඝෝෂාව)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා**

(ඝෝෂාව) මේවන විට ජල ප්‍රශ්නයක් ඇති වී තිබෙන බවත්, ජල මුලාශ්‍ර රැක ගැනීමේ අවශ්‍යතාවයක් මේවන විට පැන නැගී ඇති තත්ත්වයක් බවත්, ප්‍රාදේශීය ලේකම්තුමිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව දැනුවත් කර ඒ සඳහා අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන ලෙස තමන් යෝජනා කරන බවත්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා**

සභාපතිතුමා ඇතුළු සියලුම මන්ත්‍රී මණ්ඩලයටත්, ලේකම්තුමා ඇතුළු සියලුම කාර්ය මණ්ඩලයටත්, ලබන්නා වූ සිංහල දෙමළ අලුත් අවුරුද්ද සහ අලුත් අවුරුද්දක් වේවා කියා ප්‍රාර්ථනා කරන බවත්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා විසින් ප්‍රකාශ කළේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා**

මන්ත්‍රීවරුන්ට අත්සන් ලේඛනයක් පවත්වාගෙන යන ලෙසට දන්වා ඇති බවත්, එම ලේඛනයේ අනිවාර්යෙන් අත්සන් කළ යුතුද? සභාවට නොපැමිණ සිදු කරන කාර්යන් වලදී මෙන්ම නිවාඩු දිනවලදී එම ලේඛනයේ අත්සන් කිරීම සම්බන්ධව හා එම ලේඛනය සම්බන්ධව පැහැදිලි කිරීමක් අවශය බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමාවිසින් ප්‍රකාශ කළේ ය.

**ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා**

ලබා දී ඇති උපදෙස් අනුව කටයුතු කිරීමට සිදු වන බවත්, නිවාඩු දින රාජකාරි සිදු කරනවා නම් සභාපතිතුමා මඟින් රාජකාරි පැවරීමක් කලින් අත්සන් කර ගෙන අදාළ කාර්යන්වල නිරත විය හැකි බවත්, 2026 අප්‍රේල් මස සභා රැස්වීම සඳහා පැමිණි සියලුම මන්ත්‍රීවරුන්ට හා මන්ත්‍රීවරියන්ටත්,ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, සුභ අලුත් අවුරුද්දක් වේවා කියා ප්‍රාර්ථනා කරමින් අද දිනට නියමිත සභා කටයුතු මින් නිමාවට පත් කරන බව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන්නට විය.

2026.04.07 වන දින සාමාන්‍ය සභා රැස්වීම 12.55 ට නිමවට පති විය.

බන්ධුලසේන දුණුවිල,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2026 ක් වූ.................................මස...........දින
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.